## 2018. 04. 05 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති

## මාසික සභා රැස්වීම් වාර්තාව

**සහභාගීත්වය (-**

| | |
|---|---|
| ☞ **ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා** | ගරු සභාපති |
| ☞ **කමල් වැල්ලගේ මහතා** | ගරු උප සභාපති |
| ☞ **ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ **ඒ. ඩබ්. ජගත් කුමාර මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ **ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය** | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ **ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ **දිනයාදුර ධර්මදාස මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ ලලිත් ධම්මික කොඩිකාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ නන්දන රාජපක්ෂ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ **ආර්. එම්. ලසන්ත අජිත් කුමාර මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ **ඩෙනට් පනියන්දුවගේ මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ මගගේ අතුල ප්‍රියන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ **ඩබ්. ඒ. සෝභිත රංජිත් මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ **ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය** | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ **ජී. ජී. ආර්. පේෂලා කුමාරි මහත්මිය** | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ **එච්. ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය** | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ ඩබ්. එම්. නිලානි මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ **ධනසේන මාදුවගේ මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ කේ. ජී. පී. දයානන්ද මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ එස්. එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

☸ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ.ව. 09.30 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී** ☸

**(01)** **සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මම මන්ත්‍රීවරුන්ට මුලින්ම දැන්විය යුතුයි ආසන පැනවීම සම්බන්ධව. මම මේ සම්බන්ධව සාකච්ඡා කරා ජනතා විමුක්ති පෙරමුණේ සරත්චන්ද්‍ර මන්ත්‍රීතුමාත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතාත් පැමිණියා. ඩෙනට් පනියන්දුවගේ මහතාටත් මම ආරාධනා කරා. එතුමා පැමිණියේ දැන්. මම හිතනවා එකග වේවි කියලා. ඒ අනුව පක්ෂ නියෝජනය වන අයුරින් ආසන පැනවීමට තීන්දු කරල තියෙන්නෙ. කවුරු හරි විරෝධතාවක් තියෙනවද?

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**

මම ඔබතුමාට යෝජනා කරනවා විපක්ෂය විදියට එක්සත් ජාතික පක්ෂයත් , පොදුජන එක්සත් පෙරමුණත් සිටින බැවින් පාලන පක්ෂය වම් පැත්තෙ ඉන්නව නම් දකුණු පැත්තෙ ආසන පැනවීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අනික් පක්ෂවල ගැටළුවක් තියෙනවද?

මම සියළුම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා තමන් කථා කරන අවස්ථාවේදී තමා ඉදිරියේ තියෙන මයික් එක ඔන් කරල මූලාසනය ඇමතීම සඳහා නැගිටලා කතා කරන්න කියලා.

**(03)** **ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම**

**03:01 '** නගර සභා ශාලාවේ අවධානම් තත්වය පිළිබඳ දකුණු පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරුවරයාගේ වාර්තාව සහ කාර්ය මණ්ඩලය ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

2018-01-18- දින තමා විසින් සිදු කරන ලද ස්ථානීය පරීක්ෂණය අනුව හා තමාගේ උපදෙස් අනුව මාතර ඉදිකිරීම් ද්‍රව්‍ය පරීක්ෂණාගාරයේ තාක්ෂණ සේවා නිලධාරී විසින් කරන ලද කොන්ක්‍රීට් පරීක්ෂණ වාර්තාව අනුව පහත කරුණු අනාවරණය වන බවත් ,

1. පළමු මහලේ කොන්ක්‍රීට් බීම්ස් වලට සමාන්තරව දාර දිගේ ගැඹුරු ඉරි තැලීම් නිරීක්ෂනය වීම
2. ඉහත ඉරි තැලීම් වලට ඉහලින් බිත්තියේ ගැඹුරු ඉරි තැලීම් නිරීත්ෂණය වීම
3. ඉහල මාලයේ පොලවට සිරස්ව සුළු බලයක් යෙදීමේදී දෙදරීමක් සිදුවීම
4. බිම් මහලේ සිමෙන්ති පොලවේ ඉරි තැලීම් සහිතව සුළු ගිලා බැසීම් වලට ලක්වීම
5. 1938 වසරේ ඉදිකර ඇති මෙය පැරණි ගොඩනැගිල්ලක් වීම

යෝජනා හා නිර්දේශ ලෙස,

1. ඉහල මාලයේ ටයිල් ඇතිරීම පලදායී නොවීම
2. ජනතාව එක්රැස්වීම වැලැක්විය යුතුබව
3. මහජන ගැලරියක් සහිත සභා ගර්භයක් පවත්වාගෙන යාම අවධානම් සහිත වීම
4. බිම් මහලේ පිහිටි නගර ශාලාව තුල දෙදරීම් සහිත කටයුතු වැලැක්විය යුතු අතර නගර ශාලාවක් ලෙස පවත්වාගෙන යාම නැවැත්වීම කල යුතු වීම
5. කාර්යාලය බිම් මහලේ පවත්වාගෙන යාමට පහත කොන්දේසි වලට යටත්ව පවත්වාගෙන යාමට නිර්දේශ කරන බවත්

- පළමු මහලේ කොන්ක්‍රීට් තට්ටුවේ සිරස් ආධාරක ඉතා දුර්වල බව අනාවරණය වන බවත් පරීක්ෂණ වාර්තාව අමුණා ඇති බවත්
- ඉහල මාලයේ භාවිතා කිරීම නැවැත්වීම හා ප්‍රවේශය වසා දැමීම
- ඉහල පිරිවැයක් සහිතව ගොඩනැගිල්ල නවීකරණය කල හැකි වුවත්, ඉඩ පහසුකම් සහිතව මහල් කිහිපයකින් යුතු ගොඩනැගිල්ලක් සෑදීම වඩාත් පලදායී බවත් දන්වා තිබුණි.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි අපි මේ සම්බන්ධව ලොකු ගැටළුවකට පත්වෙලා තියෙනවා. මම හිතනවා මේක මුල් අවස්ථාවෙදිම ජාතික ගොඩනැගිලි හා පර්යේෂණ ආයතනයට යොමු කරානම් වාර්තාවක් ගන්න තිබ්බ මොකක්ද මේ ගොඩනැගිල්ලට කරන්න ඕන දේ කියන එක. අපේ කාර්ය මණ්ඩලයේ අදහසක් තියෙනවා යට තට්ටුව උඩ තට්ටුවට වඩා අවධානම් කියලා. අවධානමක් තියෙනවා නම් ඇත්තටම උඩට වඩා යට වැඩියි. එනිසා මගේ අදහස නම් සභාපතිතුමා ජාතික ගොඩනැගිලි හා පර්යේෂණ ආයතනයට යොමු කරල වාර්තාවක් අරන් මේකට ක්‍රියාමාර්ගයක් ගත්තනම් හොදයි කියන එකයි. නගර සභා ගොඩනැගිල්ල පැරණි ගොඩනැගිල්ලක් වුවත් අද සමාජයටත් ඔබින ආකාරයෙන් තමයි හදල තියෙන්නෙ. එනිසා අපි වාර්තාවක් අරගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගනිමු කියල මම යෝජනා කරනවා සභාපතිතුමනි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි මමත් ඒ යෝජනාව අනුමත කරනවා. ඊට අමතරව පහත මාලය සුදුසුයි කියල ඔය වාර්තාවෙ හරියටම කියල නැහැ. පහල මාලයේ ඉන්න එකත් අවධානම් කියලයි මම දකින්නෙ. ඒ නිසා ඉතා ඉක්මනින් ජාතික ගොඩනැගිලි හා පර්යේෂණ ආයතනයෙන් පරීක්ෂා කරල නිර්දේශයක් ගත්තොත් හොදයි කියල මම හිතනවා.

**පෙ.ව. 9.45 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. ඒ. සෝභිත රංජිත් මහතා සභාවට පැමිණෙන ලදී.**

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පහල මාලය කොන්දේසි වලට යටත්ව තමයි නිර්දේශ කරල තියෙන්නෙ. පහල මාලය ආධාරක යොදල භාවිතා කරන්න කියන්නෙ. ඉහල මාලයේ බර සම්පූර්ණයෙන්ම ඉවත් කරන්න කියල තියෙනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මෙහෙම යෝජනාවක් කරල තියෙද්දි පහල මාලයට යම් කිසි මුදලක් වියදම් කරල තියෙනවා. මේක කාගෙ වුවමනාවකට කරාද කියල මම දන්නැ. මේ අම්බලන්ගොඩ නගරයේ ජනතාවගේ බදු ගෙවන මුදල් තමයි අපි වියදම් කරන්නෙ. අපි මෙතෙන්ට පත් කරල තියෙන්නෙ මිනිස්සුන්ගෙ මුදල් හරි විදියට වියදම් කරන්න. අපි මන්ත්‍රීවරු ඒ වෙලාවෙ මෙතන හිටියෙ නැති වුනත් ඒ වෙලාවෙ පාලනය කරපු නිලධාරීන් මේවට වග කියන්න ඕනෙ. ඒ නිසා මම කරපු යෝජනාව ක්‍රියා කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ  මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි  මමත් මේකට එකග වෙනවා. මෙතන ඉන්නෙ අපේ අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයට ගියපු කෙනෙක්. මේක කඩිනමින් මුදලක් නැතිව කරගන්න අපට හැකියාව තියෙනවා. ඒනිසා මේ ගොඩනැගිල්ල අළුත් වැඩියා කරනවට වඩා තව අවුරුදු 20 කට 30 කට ඉස්සරහ පිළිබඳව අපි අවබෝධයක් ඇතිව අළුත් සැලැස්මකට පරණ ගොඩනැගිල්ල ඉවත් කරල නව ගාඩනැගිල්ලක් ඉදි කරන එක තමයි මම හිතන්නෙ කාලෝචිත වන්නෙ. නගරයෙ බදු ගෙවන ජනතාවගෙ සල්ලි පොඩි පොඩි මුක්කු ගහන වැඩ වලට යොදනවට අපේ කණ්ඩායම විරුද්ධයි. මෙතන නිලධාරීන් ඉන්නවා. යම්කිසි දෙයක් වුනොත් අපට ඒවට වගකියන්න වෙනවා. එනිසා මේ අවස්ථාවෙදි කරන්න තියෙන සුදුසුම ක්‍රියාමාර්ගය ගන්නා ලෙස මම යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම  මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි, සියළුම මන්ත්‍රීවරුනි, අපිට පොඩි ගැටළුවක් මතුවෙනවා උප සභාපතිතුමා කියපු කාරණාවත් සමග. නිලධාරීන් සම්බන්ධව. දකුණු පළාත් ඉංජිනේරු එකෙන්නෙ ඕකෙ වාර්තාව දීල තියෙන්නෙ. මම හිතන්නැ ඊට වඩා දෙයක් තියෙනවා කියලා. හැබැයි මේක නගර සභා ආදායම තුල සිදු කරන්න අමාරුයි. මේකට රාජ්‍ය අනුග්‍රහය, ප්‍රධාන අමාත්‍යතුමාගෙ අනුග්‍රහය ගන්න වේවි. මේකට තාවකාලිකව පැලැස්තර දැමීම එච්චර සුදුසු නැහැ. මේක පහල මාලයේ සිටීමත් අවධානම් කියන එකයි අපේ හැගීම. මම ඉල්ලා සිටිනවා අපේ ආයුර්වේද ගොඩනැගිල්ල හෝ ජිම් එක තියෙන ගොඩනැගිල්ල ප්‍රෙයා්ජනයට අරගෙන සේවකයන්ගෙ ආරක්ෂාව සඳහා කටයුතු කරන්න කියලා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි ඉංජිනේරු සේවා එකෙන් වුනත් පරීක්ෂණයක් කරනව නම් යොමු කරන්නෙ ගොඩනැගිලි පරීක්ෂණ ආයතනයට. මම හිතන්නෙ මේකට මුදල් යන එකක් නැහැ. ඒ නිසා ඉල්ලීමක් කරොත් මේක ඉතා ඉක්මනින් කරගන්න පුළුවන් වේවි.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සුබ උදෑසනක් වේවා. ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, සියළුම දෙනාගෙන් අවසරයි. මම පොඩි සුභද ඉල්ලීමක් කරන්න කැමතියි සභාපතිතුමාගෙන්. අපි මේ වසර හතරකට පත්වෙලා ඉන්න සභාවෙ මන්ත්‍රීවරුන් පිළිබද පොඩි හදුන්වාදීමක් කරනව නම් හොදයි කියලා. මම හිතන්නෙ මේ ගොඩනැගිල්ල ගැන කතා කිරීමේදී අවු. 80 කියන්නෙ පැරණි කාලයක් නෙමෙයි ගොඩනැගිල්ලකට. අවු.150 – 200 වන ගොඩනැගිලි තියෙනව ලංකවෙ. පාර්ලිමේන්තු ගොඩනැගිල්ල, ජනාධිපති මන්දිරය අවු 100 ට වඩා පැරණියි. අවාසනාවකට මේ ගොඩනැගිල්ල සම්බන්ධව ලබා දීපු නිර්දේශ අපිට පිලිපදින්න වෙනවා. මමත් කල්පනා කරනවා රටේ තියෙන ජාතික ආයතනයෙන් මේ පිලිබදව වාර්තාවක් ලබා ගත්තනම් හොදයි කියලා. මම දකින්නෙ මේක කඩල සමතලා කරනවට වඩා පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක තියෙනවා. නැත්නම් මේකත් නගර සභා පිට්ටනිය වගේ වෙනවා. අද තත්වය අනුව සාමාන්‍ය ගොඩනැගිල්ලක් හදන්න ලක්ෂ 400 ක පමණ පිරිවැයක් අවශ්‍යයි. මම හිතන්නැ පළාත් සභාව වුනත් මෙතරම් මුදලක් එකවර අම්බලන්ගොඩ නගර සභාවට යොමු කරයි කියලා. මධ්‍යම ආණ්ඩුව වුනත් අපි හිතන තරම් ඉක්මනින් මේකට මුදල් යොදවයි කියල මම හිතන්නෙ නෑ. එනිසා පහත මාලයට ලබා දී තිබූ නිර්දේශයට මුක්කු යොදා පවත්වාගෙන යාම ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙනුත් දෙනව නම් ඒක පිලිගන්න කියල මම මේ ගරු සභාවට යෝජනා කරනවා. මොකද අද දවසෙ වෙළද වටිනාකම අනුව මේ සභාව පවත්වගෙන යන්න ගොඩනැගිල්ලක් රු. 100000/- ක මාසික කුලියකට අඩුවෙන් ගන්න බැහැ. කවදහරි සභාව හදන දවසක වුනත් ඒ යොදන යකට ප්ලේට් අහක යන්නෙ නෑ. මේ සභාවෙ වැඩ සදහා ගන්න පුලුවන්. ඒනිසා ජාතික ගොඩනැගිලි හා පර්යේෂණ ආයතනයෙනුත් වාර්තාවක් අරගෙන සේවක මහත්ම මහත්මීන්ගෙ ආරක්ෂාව පතා රක්ෂණ සහතිකයකුත් අරගෙන මේ ගොඩනැගිල්ල අපට මුදල ප්‍රතිපාදන ලැබෙන තුරු පවත්වාගෙන යාමේ අවශ්‍යතාවක් තියෙනවා කියලයි මම දකින්නෙ. ඒ අනුව කටයුතු කරන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

**පෙ.ව. 10.00 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. එම්. නිලානි මෙනවිය සභාවට පැමිණෙන ලදී.**

**ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා කතා කරමින්**

සභාපතිතුමනි, මම හිතන්නෙ පර්යේෂණ කටයුතු කරන තුරු තාවකාලිකව වැඩ කරන පිරිස ගොඩක් ඉන්න නිසා ඒ අයගෙ ආරක්ෂාවට කාර්යාලය මෙතනින් ඉවත් කරල කටයුතු කරනව නම් වඩාත් හොදයි කියලයි.

**ගරු නගර සභා මන්ත්‍රී එස්. එම්. සරත්චන්ද්‍ර මහතා කතා කරමින්**

ජනතා විමුක්ති පෙරමුණේ මම අදහසක් ඉදිරිපත් කරනවා මූල්‍යමය වටිනාකම් වලට වඩා නගර සබාවෙ වැඩතරන සහෝදර සහෝදරියන්ගෙ ජීවිත අපිට වටිනවා. එය මිල කරන්න බැහැ. ඒනිසා හෙටම වුනත් කමක් නැහැ යන්න පුලුවන් තැනකට මේ සේවක පිරිසත් එක්ක අපි කාර්යාලය ඉවත් කර ගැනීම සුදුසුයි කියල මම යෝජනා කරනවා. රජයට බලපෑමක් කරල නව ගොඩනැගිල්ලකට මුදල් ලබා ගන්න වැඩ පිලිවෙලකටත් අපිට යන්න වෙනවා.

**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අදහස් බොහොමයක් ඉදිරිපත් වුනා. මෙහිදී මම දකින්නෙ තැන් කිහිපයකට ගියොත් ජනතාවට අපි දෙන සේවා සැපයීමේදී විශාල ප්‍රශ්න එනවා. එක තැනක හිටියොත් ප්‍රශ්න විසදගන්න ලේසියි. මට ඊයෙම එවැනි ප්‍රශ්න දෙකක් ආවා. එක් මහත්මයෙක් මාස 8 ක් තිස්සෙ ඇවිත් තිබුණා ප්‍රශ්නයකට අනික්

නෝනා මාස 8 ක් තිස්සෙ ඇවිත් තිබුනා. අපිට විනාඩි 5 කින් වගේ විසදන්න පුළුවන් වුනා බොහොම සරලව. මේ අය තැන් කිහිපයක හිටියනම් මේ දේ අපිට කරන්න බැරි වෙනවා.

සරත් මහත්මය කිව්ව වගේ අපි මේක කඩල අළුතෙන් හදන්න ගියොත් ලක්ෂ 1000 කට කිට්ටු ගානක් යාවි. පළාත් සභාවෙන්, මධ්‍යම රජයෙන් උදව් අරගෙන තමයි අපිට මේක කරන්න වෙන්නෙ. ඒ නිසා මම හිතනවා ගොඩනැගිලි පිලිබදව නිර්දේශ ලබා දෙන රජයේ ආයතනයෙන් අපි වාර්තාවක් අරගෙන ඒ අනුව අපි සුදුසු පියවරක් ගමු. දැනට ඉංජිනේරු මහතා විසින් දක්වපු නිර්දේශ සිදු කිරීම තමයි සුදුසුම දේ.

<u>**තීරණය**</u>

☞ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව ගොඩනැගිලි හා පර්යේෂණ ආයතනයෙන් නගර සභා ගොඩනැගිල්ල පිලිබදව වාර්තාවක් ලබාගෙන ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමටත්, එම කාල සීමාව ඇතුලත කාර්යාලය වෙනත් සුදුසු ස්ථානයක ස්ථාපිත කිරීම සම්බන්ධව වාර්තාවක් ලබා ගන්නා ලෙසටත් සුදුසු බව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**3:2** ‘ නගර සභා කාර්යාලයේ පහත මාලයේ අදාල සිරස් ආධාරක යෙදීම සදහා තාක්ෂණ සේවා නිලධාරී මහතා විසින් කරන ලද ඉල්ලීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

තාක්ෂණ සේවා නිලධාරි විසින් සිරස් ආධාරක යෙදීමට අදාල වන ඇස්තමේන්තුව සදහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා තිබුනි.

<u>**තීරණය**</u>

☞ ජාතික ගොඩනැගිලි හා පර්යේෂණ ආයතනයේ වාර්තාව ලැබුනු පසු මේ සදහා අනුමැතිය ලබා දීමට සුදුසු බව සභාව තීරණය කරන ලදී.

<u>**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මම සභාවෙ සියළුම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා විශේෂයෙන් නිලානි මන්ත්‍රීතුමියගෙන් සුදුසු ඇදුමකින් තොරව සභාවට පිවිසෙන්න එපා. ඔබතුමියට මතක ඇති මීට පෙරත් අපි මන්ත්‍රීවරුන් ඉවත් කරල තියෙනවා සුදුසු ඇදුමකින් සැරසිලා එන්න කියලා. ඒ සම්ප්‍රදාය ආරක්ෂා කරන්න කියල මම නිලානි මන්ත්‍රීතුමියගෙන් ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. එම්. නිලානි මෙනවිය කතා කරමින්**</u>

මම හිතන්නෙ සභාපතිතුමනි නීතියකින් නැහැ. මල ගෙවල් වලට තමයි සුදු අදින්නෙ. මේක මංගල අවස්ථාවක්. මම හිතන්නෑ සුදු ඇදීම අත්‍යාවශ්‍යම දෙයක් කියලා.

<u>**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ඔබතුමිය මීට පෙරත් හිටපු මන්ත්‍රීතුමියක්. මේක අපේ සම්ප්‍රදායක්. ඒ සම්ප්‍රදාය කඩන්න ඕක ඇදගෙන ආවද කියන්න මම දන්නෙ නැහැ. මම හිතනව ඒ අනුව කටයුතු කරයි කියලා. නැත්තම් මට ඊලඟ දවසෙදි පාට ගැන හොයල එලියට දාන්න වෙනවා.

**3:3** **'** නගර සභා ප්‍රාදේශීය සභා සංස්ථාපනය සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම **'** මැයෙන් 2018- 03- 28 දිනැති අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ ජී. සුමේධ චන්ද්‍රජිත් මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ ඉදිරි රැස්වීම් සඳහා මහජන නියෝජිතයන් සම්බන්ධ තොරතුරු අවශ්‍ය වන බවත් ඒ අනුව සභාවට අයත් ගරු මන්ත්‍රීවරුන්ගේ තොරතුරු ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**<u>තීරණය</u>**

☞ මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

☞ **පෙ.ව. 10.10 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ඒ. ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය සභාවට පැමිණෙන ලදී.**

03**:04** **'** අම්බලන්ගොඩ ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටු තීරණ දැනුම් දීම **'** මැයෙන් 2018- 03- 22 දිනැති අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් එච්. කේ. සරසි එස්. ගුණසේකර මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

2018-03-12 දින පැවති සම්බන්ධීකරණ කමිටුවේදි ගන්නා ලද තීරණ වන වාහන නැවැත්වීම සම්බන්ධ නාම පුවරු සවි කිරීම, මහා වීදියේ සහ පොදු වෙළඳපොල හන්දියේ සිට වෙරළ පාර ප්‍රතිසංස්කරණය කිරීම, රොසෙත් හන්දියේ මාර්ගයට අවහිර දැන්වීම් පුවරු ඉවත් කිරීම, ප්‍රජාපති බාලිකා විද්‍යාලය ඉදිරිපිට ඇති පිවිසුම් මාර්ගය පුළුල් කිරීම යන ගැටළු සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන ඊලඟ සම්බන්ධීකරණ කමිටුවට වාර්තාවක් සපයන ලෙසත් ඉල්ලා තිබුණි.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේක සම්බන්ධීකරණ කමිටුව බලතල ඉක්මවල ගිහිල්ල මේ කටයුතු කරල තියෙන්නෙ. මෙවැනි ඉල්ලීමක් තියෙනවනම් නගර සභාවට ඉදිරිපත් කරන්න ඕනෙ. අම්බලන්ගොඩ නගර සභාව තමයි නගරයේ රථවාහන සම්බන්ධව නීති පැනවීම කල යුත්තෙ. මෙහිදී පාරවල් වැසීමේදී ඒ සඳහා ගොදුරු වන ප්‍රෙද්ශවාසීන්ගේ කැමැත්ත අකමැත්ත ඒවත් විමසීමට ලක් කරල කටයුතු කරන්න ඕනෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි ඔතන කවුරුහරි නගර සභාවෙන් සහභාගි වෙන්න ඇතිනේ. ප්‍රාදේශීය ලේකම්තුමාට දොස් කියන්න බැහැ.

<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ට්‍රැෆික් සම්බන්ධව සහ මාර්ග නීති පැනවීම සම්බන්ධව බලය තියෙන්නෙ නගර සභාවට. නොයෙක් අංශ සමහර වෙලාවට තමන්ගෙ සීමාව ඉක්මවල නීති පනවන්න හදල තියෙනවා. එහෙම අවශ්‍යතාවක් තියෙනව නම් අපට යොමු කරල මේ මන්ත්‍රී මණ්ඩලය එක්ක සාකච්ඡා කරල යෝජනා ස්ථිර කරල ගැසට් කිරීමෙන් පමණයි අපිට නීතිය පනවන්න පුළුවන්.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි මම අම්බලන්ගොඩ සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයෙක්. අද තමයි වසර ගණනාවකට පස්සෙ මේ සභාව රැස් වුනේ. මේ සම්බන්ධීකරණ කමිටුවෙදි නගරය සම්බන්ධ තීන්දු තීරණ ගන්නවා. බලය ඉක්මවා යාමක් කිසිසේත් සිදු වෙලා නැහැ. ඔබතුමාගේ මතයට මම මගේ විරෝධතාවය ප්‍රකාශ කරනවා. ඒවගේම සරසවි හන්දියේ සිට මාර්කට් එක දක්වා සාමාන්‍ය පොඩි මරුට් බට්ටෙකුටවත් යන්න බැරි විදියට විවිධ පැතිවල ත්‍රීවීල් පාර්ක් කරනවා. විශාල කඩ හිමියන්ට ප්‍රශ්නයක් නැහැ. ඒ අයට කාගෙහෝ පිහිට ලැබෙනවා. අහිංසක දුප්පත් කඩ හිමියා බද්ද ගෙවා ගන්න බැරිව කඩ වැහෙන තත්වෙට පත් වෙලා තියෙනවා. එනිසා මාස හය හතක් විතර අම්බලන්ගොඩ නගරයේ තදබදය ගැන සාකච්ඡා වුනා. මම මේ පිළිබඳව අවස්ථා ගනනාවකදිම පොලිසියටත් නගර සභාවටත් දැනුම් දුන්නා. කියන්න කණගාටුයි අපිට නගරයේ තදබදය ගැන ක්‍රියාමාර්ගයකට යන්න බැරි වුනා. මේ නගරය තුල රථ ගාල් සඳහා ක්‍රම වේදයක් නැහැ. නගරය තුල තියෙන ඉඩ කඩ ප්‍රමාණය සැලකිල්ලට ගෙන කඩ හිමියන්ට නගරයේ ජනතාවට අවහිර නොවන පරිදි සීමා සහිත ස්ථාන කිහිපයක් හඳුනාගෙන ඒවා නම් කරල නතර කල හැකි ත්‍රීරෝද රථ ගණන තීරනය කරල වාර්ෂිකව සුළු බද්දක් නගර සභාවට අරගෙන මුලින්ම නගර සභා බල ප්‍රදේශය තුල පදිංචි දැනට ත්‍රී රෝද රථ තිබෙන අයට ප්‍රමුඛතාවය ලබා දීල අන් අයට තියෙන තැන් අනුව ප්‍රමුඛතාවය ලබා දෙන ලෙසත් අනිවාර්යෙන්ම මේ තිබෙන තදබදය අවම කිරීම සඳහා නගර සභාවත්, පොලිසියත්, ප්‍රාදේශීය සංවර්ධන කමිටුවත් එකතු වෙලා කඩිනම් විසඳුම් ලබා දිය යුතු බවට මම යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි අපි මේ අරගලය ගෙන ගියා. මේක ක්‍රියාත්මක කරන්න තමයි බැරි වුනේ. මම සතුටු වෙනවා ඒ අරගලයට තවත් මන්ත්‍රීවරයෙක් මේ සභාවට පැමිණීම සම්බන්ධව. ඩෙනට් පනියන්දූව මහත්මයා. අපේ රාහුල මන්ත්‍රීතුමත් මමත් මේ කමිටුව නියෝජනය කරා. අපි මෙහිදී ත්‍රි රෝද රථ තියෙන තැන් සලකුණු කරල පවා තිබ්බ. අපිට පොලිසියෙන් කිව්වෙ රථ නවත්වන තැන් සලකුණු කරන්න කියලා. නමුත් පොලිසියෙන්ම තමයි මේක අවුල් කරේ. අද නගරයේ කාටවත් මෝටර්

බයිසිකලයක්වත් නවත්තන්න තැනක් නැහැ. මේ නගරයේ ත්‍රීවිල් 180 ක් පමණ තමයි නවත්තන්න පුලුවන්. අද ත්‍රීවිල් 1000 කට එහා පැත්තෙ නගරෙ තියෙනවා. විශේෂයෙන්ම කියන්න ඕනෙ කටේ හයියයි ඇගේ හයියයි නිසා තමයි මේ කට්ටිය ඉන්නෙ. අපි 21 දෙනාම එකතු වෙලා මේකට පිළියමක් යොදන්න ඕනෙ. නැත්නම් අම්බලන්ගොඩ නගරයේ බදු ගෙවන ජනතාවට තැනක් නැති වෙනවා. මම කණගාටුයි කියන්න පොලිසියට ඕන විදියටයි, නගර සඑව පාලනය කරපු නිලධාරීන්ටයි ඕන විදියට තමයි වැඩ කෙරිල තියෙන්නෙ. නිලධාරීන් විසින් මෙච්චර අවහිරතා තිබියදීත් දීල තියෙනවා වාහන තුනක් නවත්වන්න සරසවි හන්දියේ. ලිපිගොනුව බැලුවහම එතන දෙන්නම බැරි තැනක්. අපි සභාවෙ තීරණයක් ගත්ත නගර සීමාවෙ අයට විතරක් දෙන්න. හැබැයි කලින් ඉදන් ඉදපු අයට දුන්නා. අපි මෙතෙන්ට ඇවිල්ල ඉන්නෙ බදු ගෙවන ජනතාවට සේවය කරන්න. එනිසා නිලධාරීන්ට ඕන විදියට වැඩ කරන එක අපි හෙලා දකිනවා. මට සතුටුයි ඩෙනට් පනියන්දුවගේ මැතිතුමාත් අපේ මතයේ ඉන්න එක ගැන. අපි එකතු වෙලා මේ සටන කරමු කියන ඉල්ලීම සමග මම නිහඩ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අපි ඇගේ හයියටයි කටේ හයියටයි බය වෙන්නෙ නැතිව කෙලින් තීන්දුවක් ගනිමු. බලධාරීන්ට කියන්න ඊලග සභා වාරයට ඉදිරිපත් කරන්න කියල අනුමත ත්‍රී රෝද රථ ගාල් කීයද? කොතනද? එය පාරට අවහිර නොවිය යුතුයි. ප්‍රමුඛතාවය අම්බලන්ගොඩ අයට දෙන්න. වාර්ෂිකව පොඩි බද්දක් අය කරන්න. පිටස්තර තැනක ගාල් කරොත් අපිට පුලුවන් කියන්න පොලිසියට නීතිය ක්‍රියාත්මක කරන්න කියලා. මේ සම්බන්ධව කටයුතු කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

සභාපතිතුමනි අපි මේ සම්බන්ධව පසුගිය කාලෙ කතා කලා. නමුත් ඔය කියන ප්‍රශ්න නිසා අපිට ක්‍රියාත්මක කර ගන්න බැරි වුනා. දැන් අපේ ඩෙනට් පනියන්දුවගේ මහතා තරයේම ප්‍රකාශ කලා එතුමාගේ සහයෝගය ලබා දෙන බව. අපේ පාලන කාලය නොමැති කාලයේ ත්‍රීරෝද රථ 3 ක් සදහා අවසර ලබාදීල තියෙනවා. අපි අම්බලන්ගොඩ අයට තමයි ප්‍රමුඛත්වය දිය යුත්තේ. අපේ අම්බලන්ගොඩ අය අවසරපත්‍ර ලබා ගන්න ගිය අවස්ථාවේ හුගක් අසරණ වෙලා තියෙනවා. මේ තුන දීල තියෙන්නෙ ගලගොඩට, මාදම්පෙට එහෙම තමයි. මම ඉල්ලා සිටිනවා ඉදිරියේදී බලපත්‍ර අඑත් කිරීමේදී එම අදාල නැති ත්‍රීරෝද 3 ට අවසර පත්‍ර ලබා නොදීමට කටයුතු කරන්න කියලා. මේ සම්බන්ධව මගේ සම්පූර්ණ සහයෝගය ලබා දෙන බව පවසමින් ඉතා ඉක්මනින් මේ කටයුතු ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලමින් මම නිහඩ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්. එම්. සරත්චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මට ප්‍රශ්නයක් තියෙනවා. ත්‍රීරෝද රථ වලට විතරද මේ ප්‍රශ්නෙ අනිත් වාහන වලට නැද්ද කියලා. මහා වීදිය, අඑත් පාර විතරක් නෙමෙයි මේ ප්‍රශ්නෙ තියෙන්නෙ. පොල්වත්ත පාර ඇල්පිටි පාර ඒ හැම එකකම හන්දිවල තවත් වාහනයකට යන්න බැරි වෙන විදියට වාහන නවත්වනවා. ඒ නීතිය

සම්බන්ධව පොලිසිය ගන්න ක්‍රියා මාර්ගය මොකක්ද? මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා පොලිසිය මීට වඩා සක්‍රිය කරන්න ක්‍රියා කරන්න කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි ඒ අදහස වැදගත්. පරණ පාරෙ ගත්තොත් හැම වෙලාවෙම ලොරි රථ එක්කො බඩු බානව, එක්කො බඩු පටවනවා. මම යෝජනාවක ඔබතුමාට ඉදිරිපත් කරනවා පරණ පාරෙ උදේ 7 ට පෙර බඩු බාන පටවන ඒව කරගන්න කියන්න. නැවත වරක් රාත්‍රී 7 න් පසු කරන්න කියන්න. මේව නිලධාරීන් ක්‍රියාත්මක නොකරොත් මමත් ගන්න හැම පියවරක්ම ගැනීමට සහයෝගය දෙනවා. මේක සල්ලි තියෙන කෙනාටත් සල්ලි නැති කෙනාටත් නීතිය පොදු විය යුතුයි. එසේ වුවහොත් අපි ඔබතුමාට සහයෝගය දෙනවා. නැත්තම් අපි විරුද්ධව ක්‍රියා කරනවා. එනිසා කරුණාකරල මෙය ක්‍රියාත්මක කරන්න . මාස දෙක තුනක් යනකොට මාරග් තදබදය අඩුවෙයි, විනයක් ඇතිවෙයි. අපිට සතුටු වෙන්න පුළුවන්. එනිසා ඔබතුමා ඒ පිලිබඳ තින්දුවක් ගන්න. ක්‍රියාත්මක වෙන්න.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මම මේ කරුනු සම්බන්ධව එකගයි. මේ සම්බන්ධව අපිට තනියෙන් තිරණයක් ගන්න බැහැ. එනිසා අම්බලන්ගොඩ පොලිසියත්, වෙළඳ සංගමයත් ඒවගේම සාමාන්‍ය ප්‍රජාව එකතු වෙලා කතා කරල ස්ථිර තීන්දුවක් ගැනීම වඩාත් සුදුසුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි පරණ පාරෙ දේවානන්ද විද්‍යාලය ගාව ඇතුල්වෙන්න බැරි වෙලාවල් දාල බෝඩ් ගහල තිබුනත් ඒ කටයුත්ත හරියට කෙරෙන්නෙ නැහැ.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි එතන වහල නැහැ. පොලිසියට අවශ්‍යනම් එදිනට වැහීමක් කරන්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අපි පළමුව පොලිසියත්, වෙළඳ සංගමයත් සමග සාකච්ඡා කරමු. මොකද නීතිය වල් වැදිල තියෙන්නෙ. අවුරුදු දෙක හමාර තුල නගරය අවිධිමත් වෙලා තියෙන්නෙ. පිටින් එන වාහනයකට නවත්තනන් තැනක් නැහැ. ඒ අය අපෙන් සේවය ගන්න එන අය.මේකෙදි ප්‍රධානම බාධකය වෙලා තියෙන්නෙ පොලිසිය. පොලිසිය නැතිව අපිට මේක කතා කරන්න බැහැ. එනිසා අපි මන්ත්‍රීවරු සහ

පොලිසිය එකතු ලෙවා සුදහදව කතා කරමු. එහිදී අදහසකට ඇවිල්ල වෙළද සංගමය, මහජනතාව සමග අවසන් තීන්දුවකට යමුයි කියල කියන්න කැමතියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්. එම්. සරත්චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි කුලරත්න පාරෙ ගාලුපාරෙ ඉදල පෝරඹ හන්දියට වෙනකන් කුලරත්න විද්‍යාලෙ ළමයි එනවා. ළමයත් එක්ක අම්ම එනකොට වාහන දෙකක් එනව නම් අම්ම ළමයත් එක්ක කානුවට බහින්න ඕනෙ. අපේ වගකීමක් තියෙනවා ඒ අයට ආත්මගරුත්වයක් ඇතිව පාරෙ යන්න පේව්මන්ට් එකක් හදල දෙන්න. මම යෝජනාවක් විදියට ඉදිරිපත් කරනවා.

**<u>තීරණය</u>**

☞ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව අම්බලන්ගොඩ පොලිසිය, වෙළද සංගමය හා මන්ත්‍රීවරුන් ඇතුළු කමිටුවක් පත්කර තීරණයක් ගැනීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**3:5** ‘ නෙස්ටමෝල්ට් බක්මහ උළෙල සදහා අනුග්‍රහය ලබා දීම ’ මැයෙන් 2018-03-20 දිනැති නෙස්ලේ ලංකා සමාගමේ ප්‍රවර්ධන කළමනාකරු අසංක මුහන්දිරම් මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

සිංහල අවුරුදු බක්මහ උළෙල සදහා ඔබ පළාත් පාලන ආයතනය නෙස්ටමෝල්ට් අනුග්‍රහය ලබා දීම සදහා තෝරා ගෙන ඇති බවත් 2018-04-21 දින එය පැවැත්වෙන බවත් ඒ සදහා අවශ්‍ය සියළු සංවිධාන කටයුතු සිදු කරන ලෙසත් ඒ සදහා ත්‍යාග නෙස්ටමෝල්ට් වෙතින් ලබා දෙන බවත් බක්මහ උළෙල පැවැත්වෙන ස්ථානය පිළිබදව දැනුවත් කරන ලෙසත් ඉල්ලා තිබුණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේවගෙ වියදම් කොහොමද? ඇස්තමේන්තුවකුත් එක්ක ඉදිරිපත් කරානම් හොදයි මේක. මෙහේ මුදල් වියදම් කරනව නම් ක්‍රමවේදයක් තියෙන්න ඕනෙ.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සදහා අපි සතයක්වත් නගර සභාවෙන් වියදම් කරන්නෙ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මම කියන්නෙ මේක ජාතික උත්සවයක්. සභාවෙ කැබ් රථය මේ බයිසිකල් රේස් එකට යනවා. ඒක ඇස්තමේන්තු වලින් දෙන ක්‍රමවේදයක් නැහැ. අවුරුදු උත්සවයක් කරන කොට මේ සභාවෙ

ආවරණ අනුමැතිය දීම අවශ්‍ය වෙනව මොකද මේක නගර සභාව සංවිධානය කරන කොට මේක අඩුවට කරන්න බැහැ. මේක සිංහල ජාතියට දැනෙන විදියට අවුරුදු උත්සවය කරන්න ඕනෙ. මේ විදිය තීරණ ගත්තොත් එතනදි නගර සභාවෙ සම්පත් පාවිච්චි කරන්න බැරි වෙනවා. එනිසා අවුරුදු උත්සවය සම්බන්ධයෙන් එකගතාවය ලබා දෙමු කියල මම ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**</u>

ගැටළුවක් නැහැ මන්ත්‍රීතුමා, මෙතුමා අනුග්‍රහය ලබා ගෙන කරාවි. අපිටත් ඕනෙ මේක කරන්න. කරන දේ විනිවිද භාවයෙන් කරහම ඇති.

<u>**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙහිදී අපි උදව් ගන්නවා අම්බලන්ගොඩ වෙළඳ සංගමයෙන්. සභාව වශයෙන් අපට කරන්න තියෙන්නෙ සංවිධාන කටයුතු කරන එක පමණයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**</u>

විරුද්ධ වීමක් නෙමෙයි සභාපතිතුමා. බලන්න නෙස්ලේ සමාගම පැහැදිලි වැඩ පිලිවෙලක් දීල තියෙනවා. ඉතින් කලින් කරපු වැඩ පිලිවෙලක් තියෙනවනේ. ඔය ලිව්මත් එක්කම අර ලිව්මත් දැම්මනම් ඉවරයි.

<u>**තීරණය**</u>

☞ නෙස්ටමෝල්ට් බක්මහ උළෙල අම්බලන්ගොඩ නගර සභාවේ සංවිධානය යටතේ 2018-04-21 දින පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණයේ දී පැවැත්වීම සඳහා **සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**03:06** ' කළුවඩුමුල්ල යෞවන සමාජ බක්මහ උළෙල - 2018 ' මැයෙන් 2018-03-21 දිනැති කළුවඩුමුල්ල තුරුණු ශක්ති යෞවන සමාජයේ සභාපතිතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත **කරන ලදී.**

කළුවඩුමුල්ල වසන්ත උදානය බක්මහ උළෙල 2018-04-20 දින පැවැත්වෙන බවත් ඒ සඳහා කළුවඩුමුල්ල ක්‍රීඩාංගණය නොමිලේ ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>**තීරණය**</u>

☞ **2018-04-20 දින පැවැත්වෙන කළුවඩුමුල්ල වසන්ත උදානය බක්මහ උළෙල සඳහා කළුවඩුමුල්ල ක්‍රීඩාංගණය නොමිලේ ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**03:07** ‘ කළුවඩුමුල්ල යෞවන සමාජ බක්මහ උළෙල සඳහා බැනර් ප්‍රදර්ශනය කිරීමට අවසර ලබා ගැනීම ’ මැයෙන් 2018-04-02 දිනැති කළුවඩුමුල්ල තුරුණු ශක්ති යෞවන සමාජයේ සභාපතිතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

කළුවඩුමුල්ල තුරුණු ශක්ති යෞවන සමාජය සංවිධානය කරනු ලබන බක්මහ උළෙලේ ප්‍රචාරක බැනර් දෙකක් අම්බලන්ගොඩ නගරයේ සහ පොල්වත්ත මංසන්ධියේ ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>**තීරණය**</u>

☞ කළුවඩුමුල්ල තුරුණු ශක්ති යෞවන සමාජය සංවිධානය කරනු ලබන බක්මහ උළෙලේ ප්‍රචාරක බැනර් දෙකක් අම්බලන්ගොඩ නගරයේ සහ පොල්වත්ත මංසන්ධියේ ගාස්තු අය කිරීමකින් තොරව ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබා දීමට **සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. එම්. නිලානි මෙනවිය කතා කරමින්**</u>

සභාපතිතුමනි මේ බැනර් සම්බන්ධව මටත් තියෙනවා පොඩි ප්‍රශ්නයක්. අපේ බෞද්ධ සංගමයෙන් වෙසක් කලාපය සම්බන්ධව බැනර් දාල තිබුන බස් නැවතුම්පොල ගාව. වෙලේ පන්සලෙනුත් බැනර් එකක් දාල තිබුනා. ඒ බැනර් තුනම කපල. ජාතික උත්සවයක් වන වෙසක් උත්සවය සම්බන්ධ බැනර් කැපීම ඇත්තටම මට කීප දෙනෙක්ම කතා කරල කිව්ව. ඔබතුමා පොඩ්ඩක් හොයා බලන්න මේව ඉවත් කරන්න හේතුව. ඒ පිළිබඳව විමසල අපි දැනුවත් කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**</u>

සභාපතිතුමා ඇත්තටම ඔය සිරි විජයාරාමයේ බැනර් එක කපපු එකට පන්සලේ හාමුදුරුවෝ මගේ ගෙදරට වැඩියා. බොහොම දුකින් තමයි කතා කරේ. ඒවගේම බෞද්ධ සංගමයේ බැනරුත් කපලා. එහෙම කරානම් ඇත්තටම අපි කණගාටුවට පත් වෙනවා. අපේ අම්බලන්ගොඩ නගරයේ දෙයක් තමයි ප්‍රදර්ශනය කරල තියෙන්නෙ. මම කියන්නෙ සභාපතිතුමා ඒ ටික නැවත ලබා දෙන්න. ඒවගේම සභාපතිතුමා බස් නැවතුම්පොලේ තියෙන ගස් වල මරණ දැන්වීමුත් අලවල. ඒක හරි අශෝභනයි. මේකට ඉක්මන් පියවරක් ගන්නයි කියල මම ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි මේ තරුණ බෞද්ධ සංගමය අපි බෞද්ධ නගරයක් විදියට ඒ අය කාර්ය භාරයක් කරනවා. එනිසා බොහොම කණගාටුයි මේ දේ සම්බන්ධව. එනිසා ඒ දෙක නැවත යොදවන්න. මින් ඉදිරියට එසේ සිදු නොකරන ලෙසත් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒ සම්බන්ධ වගකීම මම භාර ගන්නවා. ඔය බස් නැවතුම්පොල ආරම්භ කලේ 1998. එදා ඉදන් කිසිම බැනර් එකක් ප්‍රදර්ශනය කිරීම අපි තහනම් කරල තිබුනෙ. එහෙම තිබුනොත් එදිනට රාජකාරී කරපු ආරක්ෂක අංශයේ මහතාගෙන් රු.500.00 ක මුදලක් අපි කපනවා. ලංකාවෙම බස් නැවතුම්පොලවල් ගත්තොත් අපේ බස් නැවතුම්පොල විතරයි කිසිම බැනර් එකක් කටවුට් එකක් නැතිව ලස්සනට තියාගෙන ඉන්නෙ. පහුගිය අවුරුදු දෙක හමාරක කාලය තුල ඒ විනය තිබ්බෙ නැහැ. අපි මේ අයට දැන්වීම් ගහන්න තැනක් වෙන් කරල තියෙනවා. බස් නැවතුම්පොල ඉදිරිපිට ඇති භූමිය. එනිසා බස් නැවතුම්පොලේ දමා ඇති සියළුම බැනර් ඉවත් කරා. මන්ත්‍රීවරු අදහස් කරනව නම් බස් නැවතුම්පොලේ ඇතුලත දැමීම සුදුසුයි කියල හෙට ඉදන් අවසර දෙන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි මේව තිබිල තියෙන්නෙ බස් නැවතුම්පොලේ ඇතුලෙ නෙමෙයි. ලොතරැයි කූඩුව උඩ. අනික් පැත්තෙ ත්‍රීරෝද රථ ගාලට උඩින්.

**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

බස් නැවතුම්පොලේ ඇතුලෙ තියෙන ඒව තමයි ගැලෙව්වෙ. මන්ත්‍රීවරු අදහස් කරනව නම් ගහන්න දෙන්න කියල මම ඉඩ දෙන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**

මම කියන්නෑ සීමාව තුල ගහන්නය කියලා. මේදෙකම තිබිල තියෙන්නෙ උඩින්. ඔයිට වඩා අවලස්සන ඒව නෙමෙයිද පරණ පාරෙ තියෙන්නෙ. උදේ ඉදල හවස් වෙනකම් වාහන නවත්තල තියෙනවා. පාරට අවහිර කඩ ලැලි තියන් වෙලදාම් කරනවා, පාර පුරා ත්‍රීවීල් නවත්තල තියෙනවා ඒව කොච්චර අශෝභනද? ඔබතුමා මෙතැන් ඉදන් නගරය ගැන ගන්න තීන්දු ජනතාව ගැන හිතල ගන්න. අපි එතකොට ඔබතුමත් එක්ක හදවතින්ම ඉන්නවා. ඔය බැනර් ටික ගැහුවයි කියල මමනම් හිතන්නෑ අවලස්සනක් වෙනවයි කියලා.

**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙහිදී මම මුලින්ම කැපුවෙ මමයි ලසන්ත මන්ත්‍රීතුමයි පිලිගන්න බස් නැවතුම්පොලේ දාල තිබුන බැනර් දෙක.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

අපි කියන්නෙ සභාපතිතුමා මේවගේ දේකට අවසරය දෙන්න . හැම දේටම නෙමෙයි. මේක ප්‍රශ්නයක් නොවෙන විදියට බලල අවලස්සන නොවන විදියට කරන්න ඉඩ දෙන්න කියලයි කියන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්. එම්. සරත්චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා අපිට පාරෙ යනකොට පේනව පාරවල් වල නම ගහල තියෙන බෝඩ් වල එකකවත් පාරෙ නම පේන්නෙ හැහැ. ඒකෙ තියෙන්නෙ ටියුෂන් පන්තිවල නාම පුවරු. ඒ සම්බන්ධව ඔබතුමා නීතිමය පියවරක් ගනිවි කියල අපි බලාපොරොත්තු වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්</u>**

මේ බැනර් තිබුනෙ උඩින්. අම්බලන්ගොඩ බෞද්ධ නගරයක්. ඒක කපපු එකට අපෙ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

**<u>තීරණය</u>**

**මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව බස් නැවතුම්පොල ඇතුලත බැනර්, කටවුට් ප්‍රදර්ශනය සිදු නොකිරීමටත් එසේ කිරීමට අවශ්‍ය අවස්ථාවලදී සභාවේ අනුමැතිය ලබා ගෙන එය සිදු කල යුතු බවටත් සුදුසු බව තීරණය කරන ලදී.**

**පෙ.ව. 10.50 ට තේ පානය සදහා සභාව නතර කරන ලදී.**

**පෙ.ව. 10.55 ට තේ පානයෙන් පසු සභාව ආරම්භ කරන ලදී.**

**3:8** **‘** පාවිච්චි කොට බැහැර කිරීමට යෝජිත ඩෙස් බංකු (පුටු) සම්බන්ධයෙනි **’** මැයෙන් 2018-03-29 දිනැති පටබැදිමුල්ල සිරි නිකේතාරාමාධිපති පූජ්‍ය වේනමුල්ලේ සෝභිත මහා ස්ථවිර හිමියන් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභාවට අයත් හෙප්පුමුල්ල පෙර පාසලේ පාවිච්චිකොට බැහැර කරන ලද ඩෙස් බංකු අප විහාරස්ථානයේ අමාමග දහම් පාසලේ දූ දරුවන්ට ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා තිබුණි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2017 භාණ්ඩ සමීක්ෂණයේ නිර්දේශ අනුව මේ භාණ්ඩ නිකුත් කරන්න පුළුවන් කියලා දන්වල තියෙනවා. මන්ත්‍රීවරුන්ගෙ අදහස මොකක්ද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේව දෙන්න පුළුවන් හැකියාවක් තියෙනව නම් ලබා දෙන්න කියල මම ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

සභාපතිතුමා මමත් ඒක අනුමත කරනවා. පන්සලටනෙ දෙන්නෙ.

<u>තීරණය</u>

**මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව 2017/12/31 දිනෙන් අවසන් වර්ෂයේ ඉන්වෙන්ට්‍රි හා භාණ්ඩ සමීක්ෂණ වාර්කාවේ 9 වන උප වගන්තිය ප්‍රකාරව කටයුතු කර පාවිච්චියෙන් බැහැර කොට ඇති ඩෙස් බංකු සිරි නිකේතාරාම විහාරස්ථානය වෙත ලබා දීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**03:09** ‘ කුඩාරම් පහක් ලබා ගැනීම සදහා (කැනපි) ’ මැයෙන් 2018-04-03 දිනැති රියෝ ක්‍රීඩා සමාජයේ සභාපතිතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ක්‍රීඩා සමාජය විසින් සංවිධානය කරනු ලබන වයස 11 න් පහල 12 න් පහල සහ 13 න් පහල ක්‍රිකට් තරග 3 ක් පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණයේදී 2018-04-5, 06 සහ 08 දිනයන්හිදී පවත්වන බවත් ඒ සදහා අවශ්‍ය කුඩාරම් 05 ක් නොමිලයේ ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **රියෝ ක්‍රීඩා සමාජය විසින් 2018-04-5, 06 සහ 08 දිනයන්හිදී පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණයේදී පවත්වනු ලබන ක්‍රිකට් තරග සදහා අවශ්‍ය කුඩාරම් 05 ක් නොමිලයේ ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**(04)** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න නැත

**(05)** යථා පරිදි කල් දී ඇති යෝජනා

**5:1 .re uka;%Sjreka úiska bosßm;a lrk fhdackd( ke;**

**5:2 ks,Odíka úiska bosßm;a lrk mßmd,k fhdackd (**

5.2.1 ප්‍රජා මණ්ඩල ප්‍රතිසංවිධානය සඳහා අනුමැතිය ලබා ගැනීම මැයෙන් ප්‍රජා සංවර්ධන නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ යෝජනාව සභාගත කරන ලදී.

වර්තමානයේ කොට්ඨාශ ක්‍රමය පදනම් කරගනිමින් සභාව වෙත නියෝජිතයන් තෝරා පත්කරගෙන ඇති බැවින් කොට්ඨාශයේ නියෝජිත ගරු මන්ත්‍රීතුමන්ගේ/තුමියන්ගේ ප්‍රධානත්වයෙන් ප්‍රජා මණ්ඩල ප්‍රතිසංවිධානය සඳහා යෝජනා කරන බවත්, ඒ තුළින්

- කොට්ඨාශයේ සියළු ජන කොටස්වල දායකත්වයෙන් දේශපාලන බෙදීම් වලින් බැහැරව කොට්ඨාශයේ ආර්ථික හා සමාජ සංවර්ධනයට අදාළ සැලසුම් සකස් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීමට හැකි වීම
- කොට්ඨාශයේ එම කටයුතු කලට වේලාවට ක්‍රමවත්ව ඉටු කර ගැනීමට ප්‍රජා මග පෙන්වීම ලබා ගත හැකි වීම
- ජනතාවගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක වන වැඩසටහන් හා ක්‍රියාකාරකම් අඛණ්ඩව පවත්වාගෙන යාමට පමණක් නොව ආරක්ෂා කිරීමටද ජනතාව ඉදිරිපත් වීම හා එහි හවුල්කරුවකු බවට හැඟීමක් ඇති වීම
- ආදායම් ප්‍රවර්ධන වැඩසටහන්, වාර්ෂික අයවැය සම්පාදන කටයුතු වලට දායක කර ගැනීම
- පළාත් පාලන ආයතනයේ ක්ෂෙත්‍ර කටයුතු පොදු උපයෝගිතා සේවාවන් සඳහා දායක කර ගැනීම වැනි අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකියාව ලැබෙන පරිදි ප්‍රජා මණ්ඩල ප්‍රතිසංවිධානය කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි නවක මන්ත්‍රීවරු ඉන්න නිසා ඔය සම්බන්ධව පැහැදිලි කරල දෙන්න.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ප්‍රජා සංවර්ධන පනතක් තියෙනවා. කොට්ඨාශයක් කියන්නෙ ග්‍රාමසේවක කොට්ඨාශයක්. කළුවඩුමුල්ලට දෙකක් තියෙනවා. කොට්ඨාශයේ මන්ත්‍රීතුමාගේ මූලිකත්වයෙන් ගමේ ඉන්න රාජ්‍ය සේවයන්, සමෘද්ධි නියාමක, ගොවි නියාමක, ප්‍රජා සංවර්ධන නිලධාරී, ගමේ වැඩිහිටියෝ එකතු වෙලා අවශ්‍ය යෝජනා ගමේදි කතා කරල අවශ්‍යතාවන් ප්‍රමුඛතාවය අනුව පෙළ ගස්සල මෙතනට ගේන එක තමයි කරන්නෙ. මෙතනදි මේ අයගෙ උදව් අරගෙන වැඩ කටයුතු කරන්න පුළුවන්. ඒවගේම ගමේ වැඩකදි ප්‍රජා මණ්ඩලයට එම කොන්ත්‍රාත්තුව අරගෙන තමන්ගෙ ගමේ වැඩ කොටස් කරන්න පුළුවන්. එනිසා මම ඉල්ලා සිටිනවා කොට්ඨාශ 12 මන්ත්‍රීවරුන් මූලික වෙලා තමන්ගෙ ප්‍රදේශයට නගර සභාවත් එක්ක එකතුවෙලා වැඩ කොටසක් කරන්න කියලා.

<u>තීරණය</u>

☞ කොට්ඨාශයට අදාල ගරු මන්ත්‍රීතුමා හෝ මන්ත්‍රීතුමියගේ ප්‍රධානත්වය යටතේ ප්‍රජා මණ්ඩල ප්‍රතිසංවිධානය කිරීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් යෝජනා කරනු ලැබූ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**5.2.2 කරිත්තන්ද ප්‍රජාමණ්ඩලය විසින් කරන ලද ඉල්ලීම පරිදි ප්‍රජා සංවර්ධන නිලධාරී විසින් සකස් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**කරිත්තකන්ද ප්‍රජා මණ්ඩලයේ ගිණුමේ ඇති මුදලින් 2018 සිංහල අළුත් අවුරුද්ද පැවැත්වීම වෙනුවට වෙසක් උත්සවය වෙනුවෙන් පූජ්‍ය පදලංගල හිමියන්ගේ ධර්මදේශනයක් පැවැත්වීම සඳහා එම ගිණුමේ ඇති මුදල් නිදහස් කර ගැනීම සඳහාත් ඊට අදාල රු. 110000.00 ක් වූ ඇස්තමේන්තුවත් ඉදිරිපත් කර තිබුණි.**

**ප්‍රජා සංවර්ධන නිලධාරී විසින්, ප්‍රජා මණ්ඩල ව්‍යවස්ථාවේ 4 කාර්යට අනුව ඒ වගන්තිය ප්‍රකාරව මෙය ප්‍රජා මණ්ඩලයක අරමුණක් බවත් ඒ අනුව මෙම පුණ්‍ය කටයුත්ත සඳහා රු. 110000.00 මුදල නිදහස් කිරීමට යෝජනා කරන බවත් දන්වා තිබුණි.**

<u>තීරණය</u>

☞ කරිත්තකන්ද ප්‍රජා මණ්ඩල ගිණුමේ ඇති මුදලින් රු. 110000.00 ක මුදලක් 2018 වෙසක් **උත්සවය වෙනුවෙන් පූජ්‍ය පදලංගල හිමියන්ගේ ධර්මදේශනයක් පැවැත්වීම සඳහා නිදහස් කිරීම** සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා විසින් යෝජනා කරනු ලැබූ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

## (6) කාරක සභා වාර්තා සලකා බැලීම

**6: 1** 2018.04.05 මාසික සභාවේ අංක 6:01 යටතේ මූල්‍ය කමිටුව සඳහා සාමාජික මහත්ම මහත්මීන් පත් කිරීම සිදු කරන ලදී.

ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා

ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා

ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා

ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා

ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා යන මහත්ම මහත්මීන් සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය විසින් යෝජනා කරනු ලැබූ අතර ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**6: 2** 2018.04.05 මාසික සභාවේ අංක 6:02 යටතේ ටෙන්ඩර් කමිටුව සඳහා සාමාජික මහත්ම මහත්මීන් පත් කිරීම සිදු කරන ලදී.

ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා
ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා
ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා
ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා
ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා
ගරු නගර සභා මන්ත්‍රී ජී.ජී. පේෂලා කුමාරි මහත්මිය
ගරු නගර සභා මන්ත්‍රී කේ.ජී.පී. දයානන්ද මහතා
ගරු නගර සභා මන්ත්‍රී එස්. එම්. සරත්චන්ද්‍ර මහතා යන මහත්ම මහත්මීන් සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් යෝජනා කරනු ලැබූ අතර ගරු නගර සභා මන්ත්‍රී ආර්. එම්. ලසන්ත මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**6: 3** 2018.04.05 මාසික සභාවේ අංක 6:03 යටතේ පුස්තකාල කමිටුව සඳහා සාමාජික මහත්ම මහත්මීන් පත් කිරීම සිදු කරන ලදී.

ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා
ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා
ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා
ගරු නගර සභා මන්ත්‍රී ආර්. එම්. ලසන්ත මහතා
ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය
ගරු නගර සභා මන්ත්‍රී ජී.ජී.ආර්. පේෂලා කුමාරි මහත්මිය
ගරු නගර සභා මන්ත්‍රී එච්. ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය
ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා
ගරු නගර සභා මන්ත්‍රී කේ.ජී.පී. දයානන්ද මහතා
විදුහල්පති - ගා/ධර්මාශෝක මහා විද්‍යාලය
විදුහල්පති - ගා/දේවානන්ද මහා විද්‍යාලය
විදුහල්පති - ගා/කුලරත්න මහා විද්‍යාලය

විදුහල්පති - ගා/ප්‍රජාපතී ගෝතමී බාලිකා මහා විද්‍යාලය

විදුහල්පති - ගා/ග්‍රාමිණී විද්‍යාලය

කෝසල මාදුවගේ මහතා

වික්‍රමතිලක මහතා

ජේ.ජඩබ්. ජේ. ද සිල්වා මහතා

දේව මයිකල් සිල්වා මහතා

හර්බට් වීරක්කොඩි මහතා

ටුක්කාවඩු පියසිරි මහතා

රූපසිරි ජසෙන්තුලියන මහතා

එස්. එම්. පේමානන්ද මහතා

ටුක්කාවඩු හරිස්චන්ද්‍ර මහතා

සුගත් හෙට්ටිආරච්චි මහතා

ඩන්කන් ප්‍රනාන්දු මහතා

රතුවඩු මහතා

එන්.ඒ. ජයවීර මහතා

ජේ.ඩබ්. ජයන්ත මහතා

ජී. ඩබ්. ගුණසිරි මහතා

සිරිපාල මාදුවගේ මහතා

ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතා යන මහත්ම මහත්මීන් සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය විසින් යෝජනා කරනු ලැබූ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**6: 4** 2018.04.05 මාසික සභාවේ අංක 6:04 යටතේ ක්‍රීඩා කමිටුව සදහා සාමාජික මහත්ම මහත්මීන් පත් කිරීම සිදු කරන ලදී.

ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා

ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා

ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා

ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. ඒ. සෝභිත රංජිත් මහතා

ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය

ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. එම්. නිලානි මෙනවිය

ගරු නගර සභා මන්ත්‍රී එස්. එම්. සරත්චන්ද්‍ර මහතා

විදුහල්පති/ ක්‍රීඩාභාර ආචාර්ය - ගා/ධර්මාශෝක මහා විද්‍යාලය

විදුහල්පති/ ක්‍රීඩාභාර ආචාර්ය - ගා/දේවානන්ද මහා විද්‍යාලය

විදුහල්පති / ක්‍රීඩාභාර ආචාර්ය - ගා/කුලරත්න මහා විද්‍යාලය
විදුහල්පති/ ක්‍රීඩාභාර ආචාර්ය - ගා/ප්‍රජාපතී ගෝතමී බාලිකා මහා විද්‍යාලය
විදුහල්පති/ ක්‍රීඩාභාර ආචාර්ය - ගා/ග්‍රාමිණී විද්‍යාලය
ක්‍රීඩා භාර නිලධාරී - අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
අම්බලන්ගොඩ සිංහ සහ රියෝ ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් සාමාජික මහත්මාවන්
ප්‍රදීප් චන්දන මහතා - පෝරඹ, අම්බලන්ගොඩ යන මහත්ම මහත්මීන් සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කරනු ලැබූ අතර ගරු නගර සභා මන්ත්‍රී ආර්. එම්. ලසන්ත මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**6: 5** 2018.04.05 මාසික සභාවේ අංක 6:05 යටතේ නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව සදහා සාමාජික මහත්ම මහත්මීන් පත් කිරීම සිදු කරන ලදී.

ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා
ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා
ගරු නගර සභා මන්ත්‍රී ආර්. එම්. ලසන්ත මහතා
ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය
ගරු නගර සභා මන්ත්‍රී ජී.ජී.ආර්. පේෂලා කුමාරි මහත්මිය
ගරු නගර සභා මන්ත්‍රී එච්. ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය
ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා
ගරු නගර සභා මන්ත්‍රී කේ.ජී.පී. දයානන්ද මහතා
කුලසේන ගුරුගේ මහතා යන මහත්ම මහත්මීන් සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කරනු ලැබූ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**6: 6** 2018.04.05 මාසික සභාවේ අංක 6:06 යටතේ සෞඛ්‍ය කමිටුව සදහා සාමාජික මහත්ම මහත්මීන් පත් කිරීම සිදු කරන ලදී.

ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා
ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා
ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා
ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය
ගරු නගර සභා මන්ත්‍රී කෙරමිණියගේ ග්‍රේෂන් මහතා
ගරු නගර සභා මන්ත්‍රී ජී.ජී. පේෂලා කුමාරි මහත්මිය

ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය

ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා

එල්. සරත් බන්දුල මහතා යන මහත්ම මහත්මීන් සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් යෝජනා කරනු ලැබූ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**6: 7** 2018.04.05 මාසික සභාවේ අංක 6:07 යටතේ කර්මාන්ත කමිටුව සඳහා සාමාජික මහත්ම මහත්මීන් පත් කිරීම සිදු කරන ලදී.

ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා

ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා

ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා

ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා

ගරු නගර සභා මන්ත්‍රී එස්. එම්. සරත්චන්ද්‍ර මහතා

එල්. සරත් බන්දුල මහතා යන මහත්ම මහත්මීන් සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කරනු ලැබූ අතර ගරු නගර සභා මන්ත්‍රී ආර්. එම්. ලසන්ත මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**6: 8** 2018.04.05 මාසික සභාවේ අංක 6:08 යටතේ සංවර්ධන උපදේශන කමිටුව සඳහා සාමාජික මහත්ම මහත්මීන් පත් කිරීම සිදු කරන ලදී.

ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා

ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා

ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා

ගරු නගර සභා මන්ත්‍රී කේ.ජී.පී. දයානන්ද මහතා යන මහත්ම මහත්මීන් සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් යෝජනා කරනු ලැබූ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**6: 9** 2018.04.05 මාසික සභාවේ අංක 6:9 යටතේ ත්‍රීරෝද රථ හා රථවාහන කමිටුව සඳහා සාමාජික මහත්ම මහත්මීන් පත් කිරීම සිදු කරන ලදී.

ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා
ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා
ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා
ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා
ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා

ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. ඒ. සෝභිත රංජිත් මහතා
ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා
ගරු නගර සභා මන්ත්‍රී එස්. එම්. සරත්චන්ද්‍ර මහතා
එච්. මහින්දසේන මහතා
ගිවාන් සාරක විමලතුංග මහතා යන මහත්ම මහත්මීන් සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය විසින් යෝජනා කරනු ලැබූ අතර ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## (07) ටෙන්ඩර් හා මිළ ගණන්

**7** **ටෙන්ඩර් හා මිළ ගණන් (-**

7:1 **ටෙන්ඩර් (-** නැත

**7:2** **මිළ ගණන් (-**

<u>ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

**සභාපතිතුමනි මේ මිල ගණන්වල මිල විතරයි තියෙන්නෙ ප්‍රඩක්ට් එක මොකක්ද කියල නැහැ. භාණ්ඩයක් දෙන කොට ඒක ලබා දෙන කෙනා සම්පූර්ණ විස්තරේ දෙන්න ඕනෙ.**

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

**සභාපතිතුමනි භාණ්ඩවල ප්‍රමිතියක් තියෙනවා. ඒක සඳහන් වෙලා තියෙන්න ඕනෙ.**

<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

සභාවේ අවශ්‍යතාවය අනුව ඊලගට මිල ගණන් ගැනීමේදී සියළු තොරතුරු සහිතව ඒවා ලබා ගන්න.

**7:2:1** කෝලාස් මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ජී.කේ.යූ.සී. ඉන්ටර්නැෂනල් ආයතනයේ මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ජී.කේ.යූ.සී. ඉන්ටර්නැෂනල් | බිටුලින්ක් එමල්ෂන්(පුද්) සමාගම | බිටුමික්ස්(පුද්) සමාගම |
|---|---|---|---|---|---|
| **01** | කෝලාස් බැරල් (සීආර්එස්-1) | **20**<br><br>**NBT**<br>**VAT** | **11875.00**<br><br>**237.50**<br>**1781.25** | **13600.00**<br><br>**272.00**<br>**2040.00** | **12800.00**<br><br>**256.00**<br>**1920.00** |
| | | | **13893.75** | **15912.00** | **14976.00** |

**7:2:2** ගල් මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති චන්ද්‍රිකා මෙටල් වර්ක්ස් ආයතනයේ මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | කවීෂා බ්ලොක් ගල් | චන්ද්‍රිකා මෙටල් වර්ක්ස් ඇන්ඩ් ක්‍රෂර් | පී.එච්.සී.ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නෝ |
|---|---|---|---|---|---|
| 01 | චිප් ගල් කියුබ් | 15 | 7300.00 | 6000.00 | 8500.00 |
| 02 | ¾” කලුගල් කියුබ් | 10 | 6200.00 | 5000.00 | 6500.00 |
| 03 | 1½” කලුගල් කියුබ් | 10 | 6000.00 | 5000.00 | 6500.00 |

**7:2:3** සී එෆ් එල් බල්බ් මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ශෂී ඉලෙක්ට්‍රිකල්ස් ආයතනයේ මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | පූර්ණ වෙළඳ සැල | ශෂී ඉලෙක්ට්‍රිකල්ස් | ගම්පහ ඉලෙක්ට්‍රිකල් |
|---|---|---|---|---|---|

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | ස් |
| 01 | **සී එෆ් එල් බල්බ් 20W පින් ටයිප් දඟර** | 500 | ඔරෙන්ජ් 450.00 | ඔරෙන්ජ් 420.00 | ඔරෙන්ජ් 420.00 |
| 02 | **CGහෝල්ඩර් පෙට්ටි** | 05 (20 x5) | පොලික්‍රොම් 90.00 | පොලික්‍රොම් 70.00 | 90.00 |
| 03 | **සී එෆ් එල් බල්බ් U type 20W** | ඔරෙන්ජ් 380.00 | | | |

**7:2:4** **ග්‍රයින්ඩින් වීල්, කටින් වීල්, වෙල්ඩින් කූරු මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ඇල්කාටෝ හාඩ්වෙයාර් ආයතනයේ මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | පූර්ණ වෙළඳ සැල | ඇල්කාටෝ හාඩ්වෙයාර් | නිව් ස්ටර්ලින් |
|---|---|---|---|---|---|
| 01 | ග්‍රයින්ඩින් වීල් 4” | 100 | 130.00 | 130.00 | 300.00 |
| 02 | කටින් වීල් 4” | 200 | 65.00 | 59.00 | 100.00 |
| 03 | වෙල්ඩින් කූරු පෙට්ටි | | 11500 | - | |
| 04 | නො 10 - 12 | | 1150.00 | 1070.00 | 1250.00 |
| 05 | නො 10 - 12 | | 560.00 | 560.00 | 650.00 |

**7:2:5** **ඉබි යතුරු මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති පූර්ණ හාඩ්වෙයාර් ආයතනයේ මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ගම්පහ ඉලෙක්ට්‍රිකල්ස් | පූර්ණ වෙළඳ සැල | නිව් ස්ටර්ලින් |
|---|---|---|---|---|---|
| 01 | අගල් 1 | 05 | 250.00 | 160.00 | 150.00 |
| 02 | අගල් 2 | 12 | 750.00 | 700.00 | 750.00 |
| 03 | අගල් 3 | 08 | 1100.00 | 900.00 | 950.00 |

**7:2:6** **පෙරමුසු මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති කේ.ඩී.ඒ.ඩබ්. ආයතනයේ මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | කේ.ඩී.ජ්.ඩබ්. සහ (පුද්) සමාගම | | |
|---|---|---|---|---|---|
| 01 | පෙරමුසු (Cool mix) | | 10557.00 | | |
| | | | | | |

**7:2:7** **භූමදාන/ආදාහන බලපත්‍ර පොත් මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති සක්වා ප්‍රින්ටර්ස් ආයතනයේ මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සක්වා ප්‍රින්ටර්ස් | සුමුදු ප්‍රින්ටර්ස් | ඩී ආර් එස් ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|---|
| 01 | ආදාහන/ භූමදාන බලපත්‍ර පොත් | | 175.00 | 210.00 | 187.50 |

**7:2:8** **දින ලේබල් ආකෘති පත්‍ර මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති සක්වා ප්‍රින්ටර්ස් ආයතනයේ මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සක්වා ප්‍රින්ටර්ස් | සුමුදු ප්‍රින්ටර්ස් | ඩී ආර් එස් ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|---|
| 01 | දින ලේබල් ආකෘති පත්‍ර | 2500 | 1.80 | 2.10 | 2.75 |

## (08) ගෙවීම්

8.1 බස් නැවතුම්පොල ( බස් පරියන්තය ) වහල අලුත්වැඩියාව සම්බන්ධ රු. 1059140.39 ක මුදල අම්බලන්ගොඩ ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අපි මේ සභාව රැස් වෙලා තාම සතියයි වෙන්නෙ. මේ ගෙවීම් සම්බන්ධව අපි කිසිම දෙයක් දන්නෙ නැතිව අනුමත කිරීම සම්පූර්ණ වැරදි ක්‍රියාවක්. මම මේකට විරුද්ධයි.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ ගෙවීම සම්බන්ධව මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටුවේ නිර්දේශය අරගෙන තියෙනවා 2018-03-06 වෙනිදා. නමුත් චෙක්පත ලියල නැහැ. මම ගෙවනව නම් 10000 ට වැඩි නිසා සභාවේ අනුමැතිය අවශ්‍ය වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේ අළුත් මන්ත්‍රීවරු ඉන්නවා. මෙව ගැන දැනගන්න ඕනනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අපි මන්ත්‍රීවරු වෙන්න කලින් වෙච්ච මුදල් ගනුදෙනුවක්. මේක මුදල් ගෙවීමටයි අනුමැතිය ඉල්ලන්නෙ. මේකෙදි අපි මන්ත්‍රීවරු බැදීමක් නෑ කියලයි ඉල්ලන්න ඕනෙ. චෙක්පත දෙන එක විතරයි අපි කරන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

සභාපතිතුමනි මේක අපි ඇගට දාගන්න ඕන්නෑ. මේව අනුමැතිය දීපු අයටම ගෙවන්න කියල දන්වල අපි පළාත් පාලන කොමසාරිස්ටම යවමු. මේකෙ කිසිම විනිවිද භාවයක් නැනෙ සභාපතිතුමා. අපිට මේ කුණු ගාගන්න ඕන්නෑ සභාපතිතුමා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි ඔබතුමාගෙ වගකීමක් මන්ත්‍රීවරු බේරන එක. මේ සභාවෙ පහුගියකාලෙ වුන දේවල් තියෙනවා නගර සභා ඉතිහාසෙ කවදාවත් වුනේ නැති ඒව. මේකෙ බඩු ගේන්න ගිහිල්ල තියෙනවා හිස් චෙක්කොල වල අත්සන් කරලා. එනිසා මේ වෙච්ච දේවල් වලට අපිට වග කියන්න බැහැ. මේ සභාව හදන්න මේ රෙදි ගේන්න කිසිම මිල ගණන් කැදවීමක් නැතිව වාහනේ අරන් කොළඹ ගිහිල්ලා හිස් චෙක් කොලේ අරන් ගිහිල්ලා තමයි මේව ගෙනාවෙ. මේව හොයා බලන්න. මේ නගරෙ මිනිස්සුන්ගෙ සල්ලි.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේක පාලනය කරේ සහකාර පළාත් පාලන කොමසාරිස්

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

කවුරු පාලනය කරත් වැරදි වැඩේ වැරදියි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි මේකට සියළු දෙනාගේම විරුද්ධත්වයක් තියෙන නිසා , මේව නිලදාරීන් හරියට කරල තියෙනවනම් නගර සභාව නියෝජ්‍ය කොමසාරිස්තුමිය යටතෙ පාලනය වුනානම් ඒ වසර දෙක හමාරක කාලය තුල මෙවැනි ගෙවීම් කරපු විදියක් තියෙනවනෙ එතකොට අපි වගකීමට යටවෙලා නැහැනෙ. ඒ නිසා ඒ කාල වල ගෙවීම් කිරීම සදහා අපි සභාවෙ ඒකමතිකව තීරණයක් අරගෙන ඒ අයට දෙමු කරන්න කියලා.

<u>තීරණය</u>

බස් නැවතුම්පොල ( බස් පරියන්තය ) වහල අලුත්වැඩියාව නව සභාව පත්වීමට පෙර සිදු වී ඇති බැවින් මෙම ගෙවීම පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබාගෙන සිදු කිරීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

8. 2 බස් නැවතුම්පොල සාප්පු සංකීර්ණයේ වහල අලුත්වැඩියාව සම්බන්ධ රු. 796137.10 ක මුදල පනියන්දුව ප්‍රජා මණ්ඩලය වෙත ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

බස් නැවතුම්පොල සාප්පු සංකීර්ණයේ වහල අලුත්වැඩියාව නව සභාව පත්වීමට පෙර සිදු වී ඇති බැවින් මෙම ගෙවීම පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබාගෙන සිදු කිරීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

8. 3 රණසූරිය පාර පෙට්ටි බෝක්කුව ඉදිකිරීමේ විකල්ප මාර්ගය සෑදීම සම්බන්ධ රු. 386000.00 ක මුදල කවීෂා බ්ලොක්ගල් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නෝ වෙත ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

රණසූරිය පාර පෙට්ටි බෝක්කුව ඉදිකිරීමේ විකල්ප මාර්ගය සෑදීම නව සභාව පත්වීමට පෙර සිදු වී ඇති බැවින් මෙම ගෙවීම පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබාගෙන සිදු කිරීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

8. 4 වායු සමීකරණ යන්ත්‍ර මිලදී ගැනීම සම්බන්ධ රු. 454600.00 ක මුදල ගාල්ල, වක්වැල්ල පාර, ප්‍රියන්ත රිෂ් ඉංජිනියර්ස් ආයතනය වෙත ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

වායු සමීකරණ යන්ත්‍ර මිලදී ගැනීම නව සභාව පත්වීමට පෙර සිදු වී ඇති බැවින් මෙම ගෙවීම පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබාගෙන සිදු කිරීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

8. 5 නගර සභා කාර්යාලය බෙදා වෙන් කිරීම සම්බන්ධ රු. 162925.00 ක බිල්පත පින්නදූව හේවා රජිත් චන්ද්‍රසිරි මහතා වෙත ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

නගර සභා කාර්යාලය බෙදා වෙන් කිරීම නව සභාව පත්වීමට පෙර සිදු වී ඇති බැවින් මෙම ගෙවීම පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබාගෙන සිදු කිරීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

8. 6 2018 වර්ෂයට උත්සව අත්තිකාරම් ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති සභාවේ සේවකයන් හා නිලධාරීන් 130 ක් වෙනුවෙන් ගෙවීමට අවශ්‍ය රු. 1300000.00 ක මුදල ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 7 බිල්පත් අංක 12534 යටතේ අයවැය ලේඛන 25 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් සුනිල එන්ටර්ප්‍රයිසස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 11500.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 8 සෞඛ්‍ය අංශයේ සේවකයන් සඳහා බෙහෙත් ලබා දීම වෙනුවෙන් ශ්‍රී ලක්ෂ්මි ඩ්‍රග්ස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 16460.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

.

8. 9 අම්බලන්ගොඩ තල්ගස්ගොඩ දළුක්කන්ද 04 වන පටුමග නගර සභාව සතු ' තැලිගල කන්ද ' ඉඩම මැනීම් කර පිඹුරු පත් සකස් කිරීම වෙනුවෙන් බලයලත් මානක පී.ඒ. රබින් චන්ද්‍රසිරි මහතාට මැනුම් ගාස්තු ලෙස රු. 20000.00 ක් ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි මේ නගර සභාව සතු ඉඩමක් කොහොමද එහෙම දෙන්නෙ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මේ ඉඩම තියෙන්නෙ තල්ගස්ගොඩ මායිමෙනුත් එහා. එවකට කොහොමහරි කරන්දෙනියෙ ඉඩමක් මෙහේට දාල විකුණුවා. නීතියෙන් ඇත්තටම පවරල නැහැ. මාර්කට් එක වැඩි කර ගන්න තමයි එහෙම කරල තියෙන්නෙ. ඒ දීපු ඉඩම් කොටස සම්පූර්ණයෙන් බලහත්කාරෙන් කෙනෙක් අල්ලගෙන හිටියා. මේ කොටස සභාවෙ කියල කවුරුත් දන්නෑ. මම මේක හොයාගෙන සභාවෙ ඉන්න කාලෙ මැෂින් එකක් අරගෙන ගිහිල්ල මේක සුද්ධ කරා. ඒවෙලාවෙ ලොකු කලබලයක් ඇති වුනා. ඇත්තටම මේක නගර සභාවට අයිති ඉඩමක් නෙමෙයි.

<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඒ අය ඡන්දෙ දාන්නෙ කොහේටද?

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ඡන්දෙ මෙහේට හදාගෙන තියෙනවා. නමුත් කොටසක් ඉන්නවා කරන්දෙනිය ප්‍රාදේශීය සභාවටත් ඡන්දෙ දාන. ඒ අනුව තමයි මේ ඉඩම් කැබලි හතර 4 දෙනෙක් අල්ල ගත්තෙ. ඔකට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ආධාර කරා ගෙවල් හදා ගන්න. දැන් මේ මිනිස්සු ඔප්පු ලබා දෙන්නයි කියල ඉල්ලනවා. ඒ නිසා තමයි මේ මැනුම් කටයුතු කරේ. මම හිතන්නෙ ඒ අය සල්ලි ගෙව්වා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

කරුණාකරල නගර සභාවට අයිතිනම් ඒ ඉඩම කාටවත් බලහත්කාරයෙන් අත්පත් කර ගන්න ඉඩ දෙන්න බැහැ. කරුණාකරල ඊලග සභා වාරයට ඔය ඉඩම පිලිබද සියළු තොරතුරු ඉදිරිපත් කරන්න. පදිංචි වෙලා ඉන්නව නම් යම් අයෙක් නීති ක්‍රියාමාර්ග ගන්න ඒ අය ඉවත් කිරීම සම්බන්ධව. මේ නගරය සතු ඉඩම් එක එක්කෙනාට ඕන විදියට පරිහරණය කරන්න දෙන්න අපිට බලයක් නැහැ. අපි මේකට සම්පූර්ණ විරුද්ධයි.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

සභාපතිතුමා මෙතන සදහන් වුනා නගර සභාව මේ වෙනුවට වෙන ඉඩමක් ලබා ගන්නව කියලා. මේව කවුද යෝජනා කරන්නෙ. කවුද පාලනය කරන්නෙ?

**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දකුණු පළාත් සභාවෙ පෙත්සම් කාරක සභාවෙන් දීපු තීන්දුවක්.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

එහෙම ඉඩම් දෙනවනම් ඒක යම් ක්‍රමවේදයකට දෙන්න ඕනෙ. නැත්තම් හැමෝම නගර සභාවට අයිති ඉඩම් වල ගෙවල් ගහවි ගෙවල්.

**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ලේකම් තුමිය විසින් පළාත් පාලන කොමසාරිස්තුමාට පෙත්සම් කාරක සභාවෙ තීරණ ක්‍රියාත්මක කිරීම කියල ලිපියක් යවල තියෙනවා.

තැලිගල කන්ද නම් ඉඩම ගරු ප්‍රධාන ඇමතිතුමාගේ අනුමැතිය අනුව පළාත් පාලන කොමසාරිස් දකුණු පළාත උපදෙස් පරිදි පහත ඉඩම් කට්ටි හතරක් බැහැර කිරීම සදහා රජයේ තක්සේරුව ලබාගෙන විකිණීමටත් එකී පදිංචිකරුවන් වෙත විකිණීම හා මුදල් යොදාගෙන නගර සභා බල ප්‍රෙද්ශයෙන් වෙනත් ඉඩමක් නගර සභාව මිලදී ගෙන පොදු කටයුතු සදහා යෙදවීමටත් උක්ත ඉඩම පදිංචිකරුවන්ට බදු පදනම මත ලබා දීමට නියමිතය.

අදාල ඉඩම් කොටස් රජයේ තක්සේරුව ලබාගෙන ඉඩම් කටයුතු කල යුතු බැවින් අදාල මැනුම් ගාස්තු නගර සභාවට තැන්පත් කරන ලෙස පදිංචි කරුවන් වෙත දැනුම් දෙන අතර මැනුම් ගාස්තු සභාවේ

තැන්පත් කර ඇත. ඒ අනුව 2018-03-07 දින මැනුම් කටයුතු කරන ලදී. ඉඩමට අදාල මිනින්දෝරු සැලසුම් කඩිනමින් ලබා ගැනීමට ඉල්ලීම් කර ඇති අතර අදාල මිනින්දෝරු සැලැස්ම නගර සභාව වෙත ලද පසු රජයේ තක්සේරු ලබා ගැනීම සඳහා මාතර තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නියමිත බව කාරුණිකව දැනුම් දෙමි.

ඒ අනුව තමයි කටයුතු කරල තියෙන්නෙ.

මේකෙ ඉන්නෙ එම්. ඩබ්. චන්ද්‍රලතා මිය, ජ්.එම්. තනුජ චතුරංග මහතා, එච්. ජ්. ජයලත් මහතා, කේ. ඩබ්. ජයන්ත මහත්මයත් තමයි ඉන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි ඔය ඉඩම විකිණෙන්නෙනැති ඉඩමක් තිබුනෙ. කරන්දෙනියෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කියල බැනර් එක දැම්මහම රු. 15000 ට විතර තමයි ඉඩම් කට්ටිය තක්සේරු වුනේ. ඉඩම් අයිතිකාරය අම්බලන්ගොඩ නගර සීමාවෙ තියෙන්නෙ කියල බැනර් දැම්මහම 350000 ට විතර පර්චස් එක ගියා. විකුණන ප්‍රමාණෙට 10% ක් මෙහේට දෙන්න ඕනනේ. ඒ දීපු කොටස් තමයි ඔය. එතකොට කවුරුවත් ඕකෙ පදිංචිවෙලා හිටියෙ නැහැ. ඕකෙ විස්තර සම්පූර්ණ ලිපිගොනුවෙ ඇති. මේක සභාවට පවරල තියෙන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

ඔප්පුවකිනුත් පවරල නම් තියෙන්නෙ අන් අයට එහෙම අයථා ලෙස පාවිච්චි කරන්න ඉඩ දෙන්න බැහැ. කරුණාකර නීතියට අනුව කටයුතු කරන්න කියල මම ඔබතුමාට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජ්.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

සභාපතිතුමා ඔබතුමා නීතිය හොඳට දන්නවා. අධිකරණයෙන් වුනත් අයිතිකරුටනෙ ඉඩමක් දෙන්නෙ. භුක්තියට දෙන්නැනෙ. අපි මේ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග අරගෙන දැඩිව ක්‍රියා කරන්න කියලා ඉල්ලා සිටිනවා. 7 වෙනිදා මැනුම් කටයුතු කරල ඔක්කොම වැඩ ටික ඉවර කරල සභාව එන්න ඉස්සෙල්ලා. අපිට මේ කුණු නාම ගාගන්න බැහැ. එනිසා නීතිය දන්න ඔබතුමා මේ සම්බන්ධයෙන් දැඩිව නීතිය ක්‍රියාත්මක කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධයෙන් දකුණු පළාත් සභාවෙ පෙත්සම් කාරක සභාවෙන් තමයි මේ තීරණේ අරගත්තෙ. අපි තීන්දුවට විරුද්ධව යනවනම් මුලින්ම පෙත්සම් කාරක සභාවෙන් ඉල්ලන්න ඕනෙ මේ තීන්දුව නැවත සලකා බලන්න කියලා. අපි පාර්ලිමේන්තුවට සහ පෙත්සම් කාරක සභාවට බැදී සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි පෙත්සම් කාරක සභාවට මෙහෙන් ගියපු කෙනා හරියට කරුණු ඉදිරිපත් කරල නැහැ. ඒකයි වෙලා තියෙන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

පෙත්සම් කාරක සභාව දන්නැද්ද මේව රජයේ දේපලයි කියලා. රජයේ දේපල බැහැර කිරීම සම්බන්ධයෙන් පෙත්සම්කාරක සබාවට කවුරුත් කියල දෙන්න ඕනෙද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

ඉල්ලීම කරල තියෙන්නෙ පදිංචිව ඉන්න කෙනානෙ. මෙහෙන් යන නිලධාරියා දැනගන්න ඕනෙ හරියට විස්තර ටික දෙන්න. මේකයි අපේ අයිතිය කියලා.

**<u>තීරණය</u>**

නගර සභාව සතු තැලිගල කන්ද ඉඩම මැනීම් කර පිඹුරුපත් සකස් කිරීම වෙනුවෙන් මැනුම් ගාස්තුව වන රු. 20000.00 ක මුදල නව සභාව පත්වීමට පෙර සිදු වී ඇති ක්‍රියාවක් බැවින් මෙම ගෙවීම පළාත් පාලන සහකාර කොමසාරිස් හා පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය පරිදි සිදු කල යුතු බවට සභාව තීරණය කරන ලදී.

මෙම ඉඩම නගර සභාව සතු දේපලක් බැවින් පෙත්සම් කාරක සභා තීරණය පිළිබඳව නැවත සලකා බැලීමට යොමු කිරීමටත් සභාව තීරණය කරන ලදී.

ඉහත තීරණ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

8. 10 2018 පෙබරවාරි මස සැලසුම් කමිටු දීමනා වශයෙන් රු. 12327.68 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 11 ඇ. අංක 1789 යටතේ ලබා ගත් භාණ්ඩ වෙනුවෙන් පූර්ණා වෙළඳසැල වෙත මූල්‍ය කමිටු නිර්දේශය පරිදි රු. 17960.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 12 ජෙනරේටරයක් කුලියට ගැනීම වෙනුවෙන් උපේන්ද්‍ර ඉලෙක්ට්‍රිකල්ස් ආයතනය වෙත මූල්‍ය කමිටු නිර්දේශය පරිදි රු. 12000.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 13 ඇ. අංක 1751 යටතේ ලබා ගත් කොමඩ් සෙට් දෙකක් සහ කණ්ණාඩියක් වෙනුවෙන් නන්දන පී.වී.සී ආයතනය වෙත මූල්‍ය කමිටු නිර්දේශය පරිදි රු. 36650.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 14 සිලින්ඩර ලබා ගැනීම වෙනුවෙන් විස්කම් කොන්ක්‍රීට් වර්ක්ස් වෙත මූල්‍ය කමිටු නිර්දේශය පරිදි රු. 19000.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 15 ඇ. අංක 1650 යටතේ ලබා ගත් ගල් වෙනුවෙන් චන්ද්‍රිකා මෙටල් වර්ක්ස් වෙත මූල්‍ය කමිටු නිර්දේශය පරිදි රු. 25200.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 16 ඇ. අංක 1743 යටතේ ලබා ගත් වරිපනම් බදු බිල්පත් වෙනුවෙන් ග්‍රැක් කම්පියුටර්ස් පෝර්ට්ස් (පුද්) සමාගම වෙත මූල්‍ය කමිටු නිර්දේශය පරිදි රු. 35000.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 17 ඇ. අංක 1786 යටතේ ලබා ගත් ලොකට් කවර, ෆයිල් කවර වෙනුවෙන් සක්වා ප්‍රින්ටර්ස් වෙත මූල්‍ය කමිටු නිර්දේශය පරිදි රු. 16715.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 18 ඇ. අංක 1762 යටතේ ලබා ගත් ගොඩනැගිලි අයදුම්පත් වෙනුවෙන් සක්වා ප්‍රින්ටර්ස් වෙත මූල්‍ය කමිටු නිර්දේශය පරිදි රු. 122500.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 19 ඇ. අංක 1809 යටතේ ලබා ගත් පිගන් භාණ්ඩ (සභාව සඳහා) වෙනුවෙන් එච්.ජේ.සී. ඩිස්ට්‍රිබියුටර්ස් වෙත මූල්‍ය කමිටු නිර්දේශය පරිදි රු. 28560.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 20 ඇ. අංක 1799 යටතේ ලබා ගත් ලිපිද්‍රව්‍ය වෙනුවෙන් රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත මූල්‍ය කමිටු නිර්දේශය පරිදි රු. 44250.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 21 ඇ. අංක 1717 යටතේ ලබා ගත් වරිපනම් ලේඛන මුද්‍රණය හා පොත් බැඳීම වෙනුවෙන් සක්වා ප්‍රින්ටර්ස් වෙත මූල්‍ය කමිටු නිර්දේශය පරිදි රු. 33280.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 22 ඇ. අංක 1792 යටතේ සෞඛ්‍ය සහ කර්මාන්ත අංශයට ලබා ගත් ඕවරෝල් ඇඳුම් 60 ක් වෙනුවෙන් ස්පයිඩර් ගාමන්ට් ආයතනය වෙත රු. 141000.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

## (09) ගිණුම්

**9.1** 2018 ජනවාරි මාසයට අදාල ගිණුම් වාර්තා ඊලග සභාවරයට ඉදිරිපත් කිරීමට තීරණය විය.

**(10)** weia;fïka;=

10:1) නගර සභා කාර්යාලයේ උපසභාපතිතුමා  නගර සභා මන්ත්‍රීතුමන්ලා සහ ලේකම් සඳහා අදාල කාමර වලට වායු සමීකරණ යන්ත්‍ර සවි කිරීමට අදාල තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 290880/- ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි වායු සමීකරණ කරන්න අයශ්‍යා නැහැ. අනවශ්‍යා වියදමක්.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීවරුන්ගෙ කාමරය විතරක් සකස් කරල දෙන්න.

**<u>තීරණය</u>**

☞ **මෙම ඇස්තමේන්තුවට අදාල වායු සමීකරණ සවි කිරීම සිදු කිරීම අනවශ්‍යා වියදමක් බැවින් මේ සඳහා අනුමැතිය ලබා නොදිය යුතු බව උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:2) ආර්. ඊ. ද සිල්වා මාවත ප්‍රතිසංස්කරණය කිරීමට  අදාල තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 479426.70 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස මහතා කතා කරමින්</u>**

පන්සලේ ධාතු ප්‍රදර්ශනයක් තියෙනවා. ඒකටයි මේක කරන්න කිව්වෙ.

**<u>තීරණය</u>**

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා  විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:3) කළුවඩුමුල්ල නගර සභා ක්‍රීඩාංගනයේ වැට අළුත්වැඩියා කිරීම සඳහා  තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 499282.80 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අපිට මේකෙ විස්තරය ලැබුනනම් හොඳයි.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඉදිරියේදී ඒව එවන්නම්. මේක මීට වඩා අඩු ගානකින් කරන්න පුළුවන් වේවි.

**<u>තීරණය</u>**

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ් .අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:4) පනියන රණසූරිය මාවත පෙට්ටි බෝක්කුව අළුතින් ඉදි කිරීම සඳහා තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 1986952.36 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මෙය නිසි ප්‍රමිතියකින් සාදා ගැනීමටයි අවශ්‍ය. විශේෂයෙන් අතුරු මාර්ගයයි. පෙට්ටි බෝක්කුවයි. මේ මාර්ගයේ රාජ්‍ය දැව සංස්ථාව පිහිටි නිසා බර වාහන යනවා ඒ නිසා සිලින්ඩර ධාර්තාවය පිලිබඳ ප්‍රශ්නයක් තියෙනවා.ඊට එහා පැත්තෙ වෙල. පෙට්ටි බෝක්කුව හල්වතුර ඇලේ තියෙන පෙට්ටි බෝක්කුවට සමානව යන්න ඕනෙ. පෙට්ටි බෝක්කුව තැන තියෙන ඇල අනිවාර්යෙන් සුද්ධ කර යුතුයි. ගංවතුර කාලෙදි අනිවාර්යෙන් පාර යට වෙනවා. එවනිසා පාර අඩි 1 ½ වත් ඉස්සිය යුතුයි. ඒ පිලිබඳව සැලකිල්ලට ගන්නයි කියල ඉල්ලීමක් කරනවා.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔතන බෝක්කුව වෙනුවට පාරට සමාන්තරව ඇලක් කැපුවොත් බොක්කුව වහල දාන්න පුළුවන් නේද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

බෝක්කුව වහන එක ක්‍රමවේදයක් නෙමෙයි. බෝක්කුව වැහුවොත් පහත් බිම හින්දා අනිවාර්යෙන් පාර යට වෙනවා.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අළුතින් ඇලක් කපනවා පාර දිගේ ප්‍රධාන ඇලට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ඒක සාර්ථක නැහැ.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපිට බැකෝ එක තියෙන නිසා අද වුනත් වැඩේ කරන්න පුළුවන්. ඒක ප්‍රායෝගික නැද්ද කියලයි ඇහුවෙ. ඔතන ක්‍රීඩාංගණයක් හදන්න අනුමත වෙලානෙ තියෙන්නෙ. එතකොට ඔය ඇල වැහිල යනවා. එනිසා හොඳම දේ තමයි උඩ ඉඳන් පල්ලෙහා ඇලට අමතර කාණුවක් අළුතින් කපන එක. එතකොට එන වතුර පාර මේ කාණුව හරහා ගිහින් ප්‍රධාන ඇලට වැටේවි. මේක මගේ යෝජනාවක් විතරයි. ගමේ අයත් එක්කත් කතා කරල තීරණය කරන්න.

**<u>තීරණය</u>**

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු නගර සභා මන්ත්‍රී එම්. අතුල ප්‍රියන්ත මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:5) නගර සභා ක්‍රිඩාංගණයේ ඇති පැවිලියන් එකෙහි වහල අළුත්වැඩියා කිරීම සඳහා තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 479238.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:6) නගර සභා ශාලාවේ ඉතිරි කොටස බෙදා වෙන් කිරීම සඳහා තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 115606.80 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුවට අදාල බෙදා වෙන් කිරීම සිදු කිරීම අවශ්‍ය නොවන බැවින් මේ සඳහා අනුමැතිය ලබා නොදිය යුතු බව සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:7) මහජන පුස්තකාලයේ වැසිකිළි පද්ධතියේ නව වැසිකිළි වල සෑදීම සඳහා තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 124653.45 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:8) නගර සභා ක්‍රීඩාංගණයේ කොන්ක්‍රීට් කාණුව සෑදීම සඳහා තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 603891.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:9) **හල්වතුර කුණු කසල** බැහැරලන **ස්ථානයට පස් දැමීම** සදහා තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 1080000.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

අපේ වරායෙන් රට මුහුදු වැලි අදිනවා. ඇයි අපිට අඩුම වැලි කියුබ් 10 ක් 15 ක් ලබා ගන්න බැරි. දවසට 15 ගානේ ඩම්පින් යාර්ඩ් එකට යෙදෙව්වහම පස් ගේන්න ඕනෙ නැනෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

කොරිඩස්ට් වුනත් ගතහැකි රු. 2000 කට විතර.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේව හදන්නෙ දිස්ත්‍රික් කමිටු මිල ගණන් අනුව.

**<u>තීරණය</u>**

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:10) නගර සභා ක්‍රීඩාංගණයේ ක්‍රීඩා මණ්ඩපයේ වහල සෑදීම සදහා තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 906234.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>තීරණය</u>**

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**(11)** fjk;a lreKq

**11:1** අම්බලන්ගොඩ නගර සභාවේ පරිපාලන නිලධාරී විසින් ඉදිරිපත් කරන ලද මාසික සභාව සහ විශේෂ සභා සදහා සංග්‍රහ වියදම් අනුමත කරවා ගැනිම සම්බන්ධ ලිපිය **සභාගත** කරන ලදී.

**තීරණය**

මාසික සභාව සහ විශේෂ සභා සඳහා සංග්‍රහ වියදම් ලෙස එක් සභා වාරයක් වෙනුවෙන් රු. 9000/- ක මුදලක් ලබා දීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**(12)** නාාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

**12:1** **' ගෞරවයෙන් හා සුහද සිතින් කෙරෙන ආරාධනයයි '** මැයෙන් අම්බලන්ගොඩ, කළුවඩුමුල්ල සිරිවිජයාරාම විහාරස්ථානයේ සමාජ මෙහෙවරක් සඳහා විද්වත් වෘත්තික සංසදය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභාවට අළුතින් තේරී පත්වූ ඔබ සැම සුහද සිතින් පිලිගැනිම සඳහා මංගල හමුවක් 2018-04-10 දින පෙ.ව. 9.30 ට කළුවඩුමුල්ල ශ්‍රී විජයාරාම විරාරස්ථානයේදී පැවැත්වෙන බවත් ඒ සඳහා සහභාගී වන ලෙස ආරාධනා කරන බවත් දන්වා තිබුණි.

**තීරණය**

☞ **මෙම ලිපිය ගරු සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:2** ' 2018 වසරේ පැවැත්වෙන බක්මහ උළෙල සාර්ථක කර ගැනීමට සහයෝගය ලබා ගැනීම ' මැයෙන් තොරතුරු සන්නිවේදන තාක්ෂණ පුහුණු කිරීමේ මධ්‍යස්ථානය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

2018 වසරේ පැවැත්වෙන බක්මහ උළෙල සඳහා පුටු 50 ක් හා කොඩි කණු 50 ක් මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා තිබුණි.

**තීරණය**

☞ තොරතුරු සන්නිවේදන තාක්ෂණ පුහුණු කිරීමේ මධ්‍යස්ථානය විසින් 2018 වසරේ පැවැත්වෙන බක්මහ උළෙල සඳහා පුටු 50 ක් හා කොඩි කණු 50 ක් මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට **ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:3** **'** පොල්වත්ත යුනයිටඩ් බක්මහ උළෙල **'** මැයෙන් පොල්වත්ත යුනයිටඩ් ක්‍රීඩා සමාජය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

පොල්වත්ත යුනයිටඩ් ක්‍රීඩා සමාජය විසින් 2018-04-27 දින පවත්වන බක්මහ උළෙල සඳහා පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණය මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා තිබුණි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේ ක්‍රීඩාංගණය පොල්වත්තෙ ළමයින්ට ක්‍රීඩා කරන්න තියෙන තැන. අද මේ නගර සභාවෙ ඉතා අසාධාරණ විදියට පොඩි ළමයි බෝල් ගැහුවත් රු. 5000/- ක් ගන්නවා. මේක ඉතාම අසාධාරණයි. කරුණාකරල මේක නවත්තන්න. මේක ගමේ මිනිස්සු පරිත්‍යාග කරල තියෙන්නෙ ළමයින්ට සෙල්ලම් කරන්න.

**<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ පහුගිය පාලන කාලය තුල නිලධාරීන් විසින් ගාස්තු අධික ලෙස වැඩි කරල තියෙනවා. මන්ත්‍රීවරු නොමැති කාලෙදි වෙච්ච දේවල් වල ප්‍රථිපල තමයි මේව. ඇත්තටම ගාස්තු වැඩි කිරීමේදී යම් සාධාරණ භාවයක් තියෙන්න ඕනෙ. අපිට මේව වෙනස් කරන්න වෙන්නෙ ඊලග අයවැයේදි.

**<u>තීරණය</u>**

☞ පොල්වත්ත යුනයිටඩ් ක්‍රීඩා සමාජය විසින් 2018-04-27 දින පවත්වන බක්මහ උළෙල සඳහා පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණය මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට **ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:4** **'**පෙරමුසු යොදා මාර්ග පළුදු වැසීම **' මැයෙන් අම්බලන්ගොඩ නගර සභාවේ තාක්ෂණ සේවා නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය** සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සීමාවේ ඇති මාර්ග වල පළුදු වැසීම සඳහා පෙරමුසු මෙ.ටො. 50 ක් පමණ ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නගරයේ පාරවල් බොහොමයක් අබලන් තත්වයේ තියෙනවා. මේක ගල් දාල තාර දාන්න ගියොත් මාස 6 ක් වත් යනවා. එනිසා මම අපේක්ෂා කලේ අවුරුද්දට ඉස්සෙල්ලා ප්‍රිමික්ස් දාල මේ වලවල් සියල්ලම වහන්න.

**තීරණය**

☞ නගරයේ මාර්ගවල ඇති වලවල් වැසීම සඳහා පෙරමුසු මෙ.ටො. 50 ක් මිලදී ගැනීමට **ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:5** ' අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගණය අළුත්වැඩියාව ' මැයෙන් **අම්බලන්ගොඩ නගර සභාවේ තාක්ෂණ සේවා නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය** සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගණයේ ක්‍රීඩා මණ්ඩපයේ වහල සුළි සුළඟින් විනාශයට පත්වී ඇති බවත් එය අළුත්වැඩියාව කිරීම කල යුතු බවත් ඒ සඳහා මි.මි. 0.47 ඝනකම සිනික් ඇළුමින්යම් රැළි තහඩු, අඟල් 3 කොච්චි ඇණ, ඇණ සඳහා ඇලුමිනියම් වොෂර් සහ නොලීක් පටි ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගණයේ ක්‍රීඩා මණ්ඩපයේ වහල අළුත්වැඩියා කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් ඉල්ලීම් කර ඇති ද්‍රව්‍ය ලබා දීමට ගරු සභාවේ අනුමැතිය ලබා **ලබා දෙන ලදී.**

**12:6** '**සභා ගරාජය තුල අළුත්වැඩියා කරන වාහන සම්බන්ධවයි ' මැයෙන් නගර සභාවේ තාක්ෂණ සේවා නිලධාරී විසින් ඉදිරිපත් කරන ලද ලිපිය** සභාගත කරන ලදී.

2017-11-22 දින පැවති මුල්‍ය හා ප්‍රතිපත්ති කමිටුවේ තීරණ මත සභා ගරාජය තුල සිදු කරන වාහන හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමට රු. 25000.00 ක අත්තිකාරම් මුදලක් ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**තීරණය**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින්** සභා ගරාජය තුල සිදු කරන වාහන හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා වෙනුවෙන් රු 25000/- ක අත්තිකාරම් මුදලක් ලබා දීමට ගරු සභාවේ **අනුමැතිය ලබා දෙන ලදී.**

**12:7** ‘ කසල බැහැර කිරීමේ ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරීම ’ **මැයෙන් නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය** සභාගත කරන ලදී.

කසල බැහැර කිරීමේ විශේෂ ව්‍යාපෘතියේ කාලය 2018- 12- 31 දින දක්වා දීර්ඝ කිරීමට අවසර ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

**ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින්** කසල බැහැර කිරීමේ විශේෂ ව්‍යාපෘතියේ කාලය 2018- 12- 31 දින දක්වා දීර්ඝ කිරීමට ගරු සභාවේ අනුමැතිය ලබා **ලබා දෙන ලදී.**

**12:8** ‘ ආරක්ෂක සේවා ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම ’ **මැයෙන් දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් එවා තිබූ ලිපිය** සභාගත කරන ලදී.

ආරක්ෂක සේවාව ලබා ගත් ආයතනය හා නගර සභාව ඇතිකරගෙන තිබූ කොන්දේසි අනුව දෙවන පාර්ශවය විසින් සේවාවෙන් ඉවත් වීමට මාසයකට පෙර ඒ බව නගර සභාව වෙත දන්වා ඇති බවත් ඒ අනුව ගිවිසුම්ගත ඉතිරි කාලයට වෙනත් සැපයුම් කරුවකු තෝරා ගැනීමට පිරිවැයක් දරන්නේ නම් ඒ

පිලිබඳව අවධානය යොමු කරන ලෙසත් විධිමත් සභා තීරණයක් මගින් ගෙවීම් කිරීමේ කටයුතු සිදු කරන ලෙසත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

**ආරක්ෂක සේවාව ලබා ගැනීම වෙනුවෙන් 2018 ජනවාරි 01 දින සිට මාර්තු 18 දක්වා ගෙවීමට ඇති** මුදල වන රු. **427696.50 ක් වූ මුදල ගෙවීමටත්,** බැංකු ඇපකරය වූ රු. **25000.00 ක මුදල ද කාර්ය** සාධන ඇපකරය වන රු. **86048.75 ක මුදල ද නිදහස් කර ගැනීම සඳහාත් 2018-12-31 දක්වා වන ඉතිරි කාලය සඳහා සැපයුම්කරුවකු තෝරා ගැනීමේදී යම් පිරිවැයක් දැරීමට සිදුවුවහොත් එය අයකර ගැනීම සඳහාත්** සභාවේ අනුමැතිය ලබා **ලබා දෙන ලදී.**

**12:9** ‘ 2018 වෙසක් උත්සවය නිමිත්තෙන් **අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සමිතිය** පූණ්‍ය කටයුතු සම්බන්ධවයි ’ **මැයෙන් අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සමිතිය විසින් එවා තිබූ ලිපිය** සභාගත කරන ලදී.

බස් නැවතුම්පොල වෙළඳ සංකීර්ණය ඉදිරිපිට ඔරලෝසු කණුව අසල 2018 මැයි 13 සිට මැයි 29 දක්වා ආධාර මුදල් එකතු කිරීම සඳහා ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

***<u>තීරණය</u>***

**ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින්** බස් නැවතුම්පොල වෙළඳ සංකීර්ණය ඉදිරිපිට **අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සමිතිය** වෙත ඔරලෝසු කණුව අසල 2018 මැයි 13 සිට මැයි 29 දක්වා ආධාර මුදල් එකතු කිරීම සඳහා **ලබා දීමට ගරු** සභාවේ අනුමැතිය ලබා **ලබා දෙන ලදී.**

✪ fjk;a lreKq

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණයේ ගාස්තු අය කිරීම ගොඩාක් වැඩියි. මේක ළමයින්ට කරන අසාධාරණයක්. මේක වහාම නවත්වන්න සභාපතිතුමා. රු. 500.00 කට වඩා අය කරන්න එපා.

<u>ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ කතාවෙ සත්‍යක් තියෙනවා. අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගණය දැන් නැති නිසා සියළුම අය එන්නෙ මේ පිට්ටනියට. පොල්වත්තෙ ඉන්න ළමයි මේ පිට්ටනියෙ ඕනෙ සෙල්ලම් කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි අපිත් මේ නගර සභා ක්‍රීඩාංගණයෙ ක්‍රීඩා කරපු අය. කවදාවත් පාසල් ළමයිටයි ක්‍රීඩා සමාජ ළමයිටයි සල්ලි ගත්තෙ නැහැ. එහෙම වුනොත් අනාගයට එන්න ඉන්න ක්‍රීඩකයන් අපට අඩු වෙනවා. එනිසා කරුණාකරල මේව සංශෝධනය කරන්න. ක්‍රීඩාංගණ නඩත්තු කටයුතු වෙනුවෙන් සුළු මුදලක් අය කරාට කමක් නැහැ.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මම පිලි ගන්නවා. අපිට ඊලග අයවැයේදි තමයි මේක සංශෝධනය කරන්න පුළුවන්.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි එච්චර කල් ඉන්න එපා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්. එම්. සරත්චන්ද්‍ර මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි මේක ලාභ ඉපයීමේ මාර්ගයක් කර ගන්න එපා. මේක පොල්වත්තෙ කොල්ලන්ට සෙල්ලම් කරන්න තියෙන්න ඕනෙ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

සභාපතිතුමනි මටත් පොල්වත්තෙ අය කීප දෙනෙක් කිව්ව ඒ අයගෙ පිට්ටනිය නගර සභාව සතු කර ගත්ත කියලා. ලොකු අසාධාරණකමක් කියල කරන්නෙ.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පොල්වත්තෙ මන්ත්‍රීතුමන්ලාගෙ මාර්ගයෙන් පොල්වත්තෙ අයට අවශ්‍ය වෙලාවට ඉල්ලීම් කරන්න කියන්න. එතකොට නොමිලේ ගන්න පුළුවන්.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි සභාවට ලැබෙන්න තියෙන ආදායම් එක එක ආයතන පවරගෙන තියෙනවා. නිවාස සැලසුම් කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය විසින් පවරගෙන තියෙනවා. ඒ නිසා විෂය භාර අමාත්‍යතුමාට ඉල්ලීමක් කරල නැවත ඒ බලය අපටම ලබා දෙන්න කියල. නැත්තම් මේ ආයතන පවත්වගෙන යන්නට බැරි වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි ඒක අපිට විතරම් සිදු වුන දෙයක් නෙමෙයි. අපටත් අයදුම්පතේ ඉදල මුදලක් ලැබෙනවා. නාගරික සංවර්ධන අධිකාරියටත් වර්ග අඩි ප්‍රමාණය අනුව මුදලක් ලැබෙනවා. මම හිතන්නෙ අපට විතරක් වෙනසක් සිදු කරන එකක් නැහැ.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි බලමු ඉල්ලීම් කරල මොකක් හරි කරන්න.

මම මන්ත්‍රීවරුන්ට කියන්න ඕනෙ මට FCID එකෙන් කැඳවීමක් කරල තිබුණ තානායම සම්බන්ධව. එහිදී මම දැකපු දෙයක් තමයි ලිපිගොනුවෙ තිබ්බ්ව ලිපි රාශියක් ඉවත් කරල තියෙනවා. උදාහරණයක් වශයෙන් මේක කඩපු වෙලාවෙ මම හිටපු ලේකම් වරයාට නියෝග කරා අදාල අම්බලන්ගොඩ පොලිසියේ මේ සම්බන්ධව පැමිණිලක් දාන්න කියලා. ඒ ලියපු කොලේ පවා ඉවත් කරලා.

මන්ත්‍රීවරුන්ට දැන ගන්න මම කියන්න ඕනෙ අම්බලන්ගොඩ තානායම නාගරික සංවර්ධන අධිකාරිය මගින් පවරගෙන නැවත අම්බලන්ගොඩ නගර සභාවට පවරන්නෙ නැතිව දකුණු පළාත් සභාවෙ සංචාරක කාර්යාංශයට. ඊට පස්සෙ අපේ අවසරයකින් තොරව කඩා ඉවත් කරා. අපි ඒ වෙලාවෙ අපේ අවසරයකින් තොරව තානායම කඩා ඉවත් කරල කියල අපි පොලිසියේ පැමිණිල්ලක් දැම්මා. තානායම කඩන්න පළාත් සභාව අය කරගෙන තිබුණෙ රු. 75000.00 යි. ඒක අයකරගෙන නැවත අළුත් රෙස්ට් හවුස් එකක් හදල දෙනවයි කියන පදනම මත අපට පොරොන්දු වෙලා ඒ කටයුතු කරා. නමුත් පළාත් සභාවට ඒ කාර්ය කරන්න බැරිවුනා. අපි සභාව විසින් නැවත ඉල්ලීමක් කරා පළාත් සභාවෙන් රෙස්ට් හවුස් එක පවරල දෙන්න කියලා. පළාත් සභාවෙන් පවරගෙන මීට අවුරුදු 6 කට පෙර සුදුසු ටෙන්ඩර් කරුවෙකුට භාර දුන්නා අවු 50 කට. මසකට රු. 175000.00 ක බද්දකට කාමර 50 ක හෝටලයක් ඉදි කිරීම සඳහා. අවුරුදු 5 කට වතාවක් බද්ද 25% ක් වැඩි වෙනවා. අද වෙනකොටත් ඒ අය ගෙවල තියෙන්නෙ. සභාවට මේ අවුරුදු 6 ඇතුලත හානියක් වුනේ නැහැ. නිලධාරී පාලනයේ පසුගිය අවු. 21/1 ඇතුලත ලිපිගොනුවේ ලිපි රාශියක් ඉවත් කරල තියෙනවා. මන්ත්‍රීවරුන්ට ඕන කෙනෙක්ට මේ ලිපිගොනු පරීක්ෂා කරන්න පුලුවන්.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි මම අහන්නෙ අම්බලන්ගොඩ අපට තිබුන උරුමය කවුරු කැඩුවත් අපි ඒකට තදින් විරුද්ධයි. නගර සභාව විසින් මේක හෝටලයක් ඉදි කරන්න ටෙන්ඩර්කරුවෙකුට ලබා දුන්නා කියලා. මේක භාර දුන්නෙ නිසි ක්‍රමවේදයක් තුලද කියල අපි දැනගන්න කැමතියි. අපි ගිවිසුමක් අත්සන් කරන කොට අඩංගු විය යුතු මූලික කරුණු තමයි මේ කාල පරිච්ඡේදය තුල මේ ව්‍යාපෘතිය අවසන් කරන බව තිබිය යුතුයි. මේ සමාගම විසින් බදු මුදල් නිසි පරිදි ගෙවා තිබේද? කුමන හේතුවක් නිසා ගිවිසුම කඩ කර තිබේද? කියන්න කණගාටුයි අදට නම් උදේ හත අට වෙනකොට ගැහැණු ළමයි අරගෙන පිරිමි අය එන රජකාලෙ තිබුණ ලයිසන් දුන්නු භූමි භාගයක් වගෙයි. ඒවගෙම වෙලද හිමියන්ගෙ රථ ගාලක් බවට පත්වෙලා. ඇත්තටම මගේ කණගාටුව ප්‍රකාශ කරනවා එවකට හිටපු නාගරික මන්ත්‍රීවරු සම්බන්ධව. අපි අපේ උරුමය ආරක්ෂා කර ගත යුතුයි. මම ඔබතුමත් එක්ක දෙපයින් සිට ගන්නවා මේ තානායම නැවත නගර සභාවට සතු කර ගන්න. නැවත අපි නගර සබාව සතු තානායමක් ගොඩනගන්න කටයුතු කරමු කියල මම යෝජනා කරනවා. මම ඒ සඳහා ඔබතුමාට රජය පැත්තෙන් ලබා දෙන්න පුලුවන් ඉහලම උදව්ව, උපකාරය වගකීමෙන් කියනවා මම ලබා දෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

සභාපතිතුමනි මම ඩෙනට් පනියන්දූවගේ මහතාට ස්තුතිය පුද කරනවා. මට මතක විදියට අපි අවු 35 ට තමයි එකග වුනේ. අපි කාලයක් දුන්නනෙ මේක හදන්න මුලින්ම් කාමර 25 ක්. ඒගොල්ලො අපට බදු මුදල දෙන එක වැඩක් නෑ. අපේ අරමුණ වුනේ යම් ක්‍රමවේදයකට ඔතන තානායම ගොඩනැගෙන්න. ඒ ගිවිසුම අනුව කටයුතු කරන්නෙ නැත්තම් ගිවිසුම අවලංගු කරල ඩෙනට් පනියන්දූවගේ මැතිතුමා කිව්ව සහයෝගය ලබා දෙනව කියල ඒනිසා අපි මෙය නැවත අපි විසින් ගොඩ නගල අපේ උරුමය රැක ගනිමු කියල ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි නවක මන්ත්‍රීවරුන්ට ගිවිසුමේ පිටපතක් ලබා දෙන්න කියල ඉල්ලා සිටිනවා. ඒ නිසා ඒක න්‍යාය පත්‍රයට ඇතුලත් කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

න්‍යාය පත්‍රයට දාන්න යෝජනාවක් විදියට ඉදිරිපත් කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. එම්. නිලානි මෙනවිය කතා කරමින්**

සභාපතිතුමනි විපක්ෂ නායකතුමා මේ සම්බන්ධව කතා කිරීම සම්බන්ධව ස්තුති වෙනවා. අම්බලන්ගොඩ ජනතාව නිතර අහනවා මේ සම්බන්ධව. ඒ අය අදාල කාලය තුල ඒ දේ කරන්නෙ නැත්තම් අහන්න ඕනෙ. ඒ දුර්වල කම ඔබතුමාගෙ සභාවෙන් කෙරිල තියෙන නිසා තමයි අද මෙහෙම වෙලා තියෙන්නෙ. අපි දන්නව දැන් එතනට උදාවෙලා තියෙන තත්වය. අපේ නාන තටාකයත් දැන් ගොඩ වෙලා තියෙන්නෙ. වරාය හදන කොටත් නුසුදුසු තැනක හදපු නිසා තමයි අද අපට ලස්සනට තිබුන මුහුදු වෙරල නැතිවෙලා තියෙන්නෙ. ඒ නිසා මින් පසුව ඔබතුමා තීරණ ගන්න කොට නගරෙට ආදරෙන් තීරණ ගන්න කියා ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්**

සභාපතිතුමනි මම ඉල්ලා සිටිනවා දැනට බදු දීපු කොම්පැනියට කියන්න එතන තාප්පෙ බැදලා ගේට්ටුවක් දාල පූල් එක සුද්ධ කරල දෙන්න කියලා. මෙතන හුගක් අපචාර සිදු වෙන හින්දා මේක ඉක්මනින්ම කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

ඔය ගිවිසුම අපි ඉන්න කාලෙ තමයි හැදුවෙ. මම ඉල්ලා සිටිනවා කළමනාකරුවන් මෙහේට ගෙන්නල මෙය ආරම්භ කිරීම සදහා කටයතු කරන්න. මේ සම්බන්ධව කාලය ගියා වැඩියි.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

අපි මේ ගිවිසුම වට ගණනාවක් සාකච්ඡා කරා. මට මතක අවු 35 කට වගේ දුන්නෙ. මම එදා සාකච්ඡා වලදි කිව්ව කාමර 25 ක් මුලින් හදන්න කියලා. ගිවිසුමට දැන් අවුරුදු හතරයි මාස හතරක් විතර වෙනවා. අපි ඒගොල්ලන්ට අවුරුද්දක සහන කාලයක් දුන්නා. තාම බැරිවුනා මෙයාලට එක කාමරයක්වත් හදන්න. මේ ගිවිසුමේ කාලය මේ වන විට අවසන් වෙන්න ඕනෙ. මේක දිගින් දිගට

ගියෝත අපි හිටපු මන්ත්‍රීවරු වශයෙන් මේක අපිට ලොකු කැලළක්. එක්කො මේ ගිවිසුමෙන් අයින් වෙලා වෙන කම්පැනියකට දෙන්න. අපි අවුරුදු දෙක හමාරක් හිටියෙ නැති වුනත් ගිවිසුම ප්‍රකාරව වැඩ කරන්න තිබුනා නිලධාරීන්ට. මේ ගිවිසුම සම්බන්ධව කටයුතු කරන්න කියල මම ඉල්ලා සිටිනවා සභාපතිතුමනි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි මට හිතෙන්නෙ මේ වන විටත් ගිවිසුම කඩවෙලා අවසානයි. නීතිමය අයිතියක් තියෙනවා ඒ සමාගම බ්ලැක් ලිස්ට් කරන්න. ඇයි මේක කඩවෙලා මෙච්චර කල් ගියේ කියලත් ප්‍රශ්නයක් එයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි අපි මුල ඉදන්ම හිටපු අය විදියට මේ ගැන තේරුම් කර දිය යුතුව තියෙනවා. මා දන්නා සත්‍ය මේ සභාවට ඉදිරිපත් කල යුතුයි. මේක කඩා ඉවත කිරීම පළාත් සභාව කාලෙදි කරපු දෙයක්. හැබැයි අපට පළාත් සභාවෙන් නැවත නගර සභාවට පැවරිලත් අවු 7 ක් 8 ක් යනතුරු කිසිදු ආදායමක් නොමැති තත්වයක මේක තිබුනෙ. ඒ කාලය තුල නාගරික සංවර්ධන අධිකාරිය හරහා ආපේජකයනක් සොයනු ලැබුවා. අසාර්ථක වුනා. නැවතත් මේක සාමාන්‍ය අයට දීමට බැලුවා. ඒවත් අසාර්ථක වුනා. නැවතත් නාගරික සංවර්ධන අධිකාරියෙන් මේක ටෙන්ඩර් කරන්න කිව්වහම පුරා විද්‍යා දෙපාර්තමේනුතුවෙන් අවසර ගත යුතුව තිබුනා ටෙන්ඩර් කිරීමට ප්‍රථම. ගාල්ලෙ පුරා විද්‍යා එකෙන් අවසර දුන්නා මේ තුල තිබුන අඩි 2 ක ඝනකම බිත්ති ඒ බිත්ති හැර හා අශ්ව ස්ථාලය හැර අනික් දේවල් ඉවත් කරල රෙස්ට් හවුස් එක හදන්න. ඒ ටෙන්ඩර් කිරීමේදී මමත් සුදුසුකම් ලැබුවා. නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය පවා ලැබුනා. සම්මුඛ පරීක්ෂණ මන්ඩලයේ හිටපු සියළුම ලේකම්වරු අනුමැතිය දුන්නා මේක තියෙන ආකාරයෙන් පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි වැඩ කරන්න කියලා. මම පෙරසැරි ගාස්තුත් ගෙව්වා. අවාසනාවකට මාස දෙකක් යනතුරු මට අනුමැතිය ලැබුනෙ නෑ. ඒ වෙලාවෙ හිටිය ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතා. මම එක්සත් ජාතික පක්ෂෙ උප සභාපති. මට කිව්වා මේ පැත්තට එනව නම් මේක ලබා දෙන්නම් කියලා. මම එතුමට කිව්ව ජනතාව ඡන්දෙ දීල තියෙන්නෙ මගේ පුද්ගලික දේවල් වලට නෙමෙයි. මම මන්ත්‍රීකමෙන් පස්සෙ එන්නම් කියලා දැන් බැහැයි කියල මම කිව්වා. අපිට මේ මන්ත්‍රී ධුරය නිසා අහිමි වෙච්ච පුද්ගලික දේවල් තමයි ඒ. ඊට පස්සෙ ඒ ටෙන්ඩර් එක අහෝසි වෙලා ගියා. නැවත කිහිප වතාවක් ටෙන්ඩර් කරා. සුදුසුකම් ලත් කෙනෙක් ඉදිරිපත් වුනේ නැහැ. ඒ අනුව තමයි සභාව තීරණය කරේ BOI සුදුසුකම් ලත් ආයතනයකින් මේක ටෙන්ඩර් කරන්න. ආයතන දෙකක් ටෙන්ඩර් ඉදිරිපත් කරල තිබුනා. ඒකෙන් එක ආයතනයක් සුදුසුකම් ලැබුවා. ඒ අනුව තමයි 2013දි අපි ගිවිසුම් අත්සන් කරල මේ දේපොල එම ආතයනයට පැවරුවෙ. ඒ ආයතනය කොටස් වෙලඳ පොලේ ලැයිස්තුගත සමාගමක්. ඒ සමාගමත් ලොකු ලොකු ආයෝජකයො ගෙනල්ල අම්බලන්ගොඩ නගරයේ තානායම දියුණු වෙන විදියට තමයි කටයුතු කරන්නෙ. මේ සමාගම අද වෙනකොට විකිණිලා අවසන්. අද වෙනකොට අයිතිකරුවන් වන්නෙ එංගලන්තෙ සමාගමක්. ඔවුන්ට තමයි දැන් මේ දේපලේ අයිතිය තියෙන්නෙ. ඔවුන් කියන්නෙ මේකෙ ආයෝජනය කරනව කියලා. මේ අයට වෙරළ සංරක්ෂනෙන් අවසරය දීල නැහැ. නාගරික සංවර්ධන අධිකාරියෙන් අවසරය

දීල නැහැ. මේවගේ අනුමැතීන් 10 ක් 15 ක් විතර ගන්න තියෙනවා. ඒ අනුමැතීන් ලැබුනට පස්සෙ තමහයි මුල්ගල තියන්න පුලුවන්. අනිත් එක මම කියන්නෙ හෙට අපි මේ ගිවිසුම අවලංගු කරත් නැවත දෙන්නවෙන්නෙ ආයෝජකයෙකුට. මම කියන්නෙ අපි ඒ දේට යනව නම් ආයෝජකයෙක් හොයාගෙන කරමුයි කියල තමයි. ඒ නිසා අපි තීන්දුවක් ගන්නව නම් මීට වඩා හොද ආයෝජකයෙක් හොයල තමයි කරන්න වෙන්නෙ. මම මේ දේ කිව්වෙ මම දන්න 100% ක්ම සැබෑ දේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි සරත් මහතාගේ කතාවෙක් කියවුන විදියට මේ 2013 ගත්තයි කයන මේ සමාගම මම කිසිසේත් විශ්වාස කරන්නෙ නැහැ රට තුල තියෙන ආයතන වලින් අවසර ගැනීමට වසර 5 කට ආසන්න කාලයක් යාවි කියලා. මෙතන ගැටළුවක් තියෙනවා. ඒ සමාගම සත පහක්වත් වියදම් කරල නැහැ. එනිසා මෙය සභාව සතු වෙන්න ඕන. ගිවිසුමේ ඒ කරුණු නැත්තම් ඔබතුමා ඇතුළු මන්ත්‍රී කණ්ඩායම සහ නිලධාරීන් සියළු දෙනා වග කිව යුතුයි. මොකද ගිවිසුමට කොන්දේසි ඇතුලත් වෙන්න ඕනෙ. මම ලිඛිතව ඊලග සභාවට තොරතුරු ඉල්ලනවා.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ තානායම සම්බන්ධයෙන් යම් දෙයක් මා කිව යුතුයි. 1997 අපි බලයට එනකොට සම්පූර්ණයෙන්ම වහල දාල කඩන් වැටෙන තත්වයේ තිබුනෙ. අපි ගිහිල්ල සුද්ද කරල අලුත් ටෙන්ඩර් කරුවෙක් හොයල දැම්ම. ඒ ටෙන්ඩර් කරුවා 2002 ඉදන් 2006 දක්වා එක්සත් ජාතික පක්ෂ පාලන කාලෙදි කිසිම බද්දක් ගෙවන්නෙ නැතිව එක්කෝටි දස ලක්ෂයක් නගර සබාවට පොල්ලක් තියලා තිබුනා 2006 අපි බලයට පැමිණෙන විට. අපි 2006 දි මේක සීල් කරා. ඒ වසරෙදි මම එක්සත් නගර සභා සම්මේලනයේ සභාපති වුනා. ඒ අවස්ථාවෙ ලංකාවෙම තානායම් 40 ක් නගර සභාවලින් පවරගෙන තිබුන නාගරික සංවර්ධන අධිකාරියට. ඒ අනුව අපි ඉල්ලීමක් කරා නැවත තානායම් ටික පවරන්න කියල නගර සභාවලටම. ඒ අවස්ථාවෙදි ඇමතිවරයා විසින් මේ 40 ම නගර සභාවලට පැවරීමට තීන්දුවක් ගත්තා. අපේ ප්‍රධාන අමාත්‍යතුමා ලියුමක් ඇරලා ලක්ෂ 300 ක් වියදම් කරනවා මේක හදන්න කියලා. මට දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා කතා කරල කිව්ව මහ ඇමතිතුමා මේක හදනව නම් ඒකට ඉඩ දෙන්න කියලා. හැදුවට පස්සෙ භාර ගන්න කියලා. ඒ අනුව අනික් තානායම් 39 ම නගර සභාවලට පවරද්දි අම්බලන්ගොඩ තානායම පමණක් දකුණු පළාත් සභාවට පවරනු ලැබුවා. පළාත් සභාව මගින් දකුණු පළාත් සංචාරක කාර්යාංශයට පැවරුවා. සංචාරක කාර්යාංශය මෙය අළුතින් ඉදි කිරීමට යැයි පවසා මේක කඩල ඉවත් කරා. මුල් ගලකුත් තිබ්බා. කාලයක් ගියා. පස්සෙ අපි පළාත් සභාවෙන් ඉල්ලිමක් කරා නැවත අපිට පවරන්න. අපි නිසි ආයෝජකයෙක් ලවා මේක ඉදිකිරීමට බලාපොරොත්තු වෙනවයි කියලා. ඊට පස්සෙ පළාත් සභාවට මේක කරන්න බැරි නිසා අපිට පැවරුවා. මේකෙ ඩ්‍රොවින් එකක් ඇදල තිබුනා. ඒකට ලක්ෂ 68 ක් ගෙවල තිබුනා. නගර සභාවෙන් ඉල්ලුවා ඒක ගෙවන්න කියලා. අපි කිව්ව අපේ ඉල්ලීම පරිදි නෙමෙයි මේක කැඩවෙත් අපේ ඉල්ලීම පරිදි නෙමෙයි මේක ඇන්දෙත්. ඒ නිසා ගෙවන්න බැහැ කියලා. ඒගොල්ලො ඒ පාඩුව දරාගෙන අපට පැවරුව. අම්බලන්ගොඩ නගර සභාව සිංහල, දෙමල, ඉංග්‍රිසි යන පත්තර 3 කම දැන්වීම් දාල සංවර්ධනය කරන්න කැමති අයෙක් ඉන්නව නම් ඉදිරිපත් වෙන්න කියලා ටෙන්ඩර් කරා. අපි ඒ ටෙන්ඩර් කරු සමග මේ සභාව විශාල ලෙස

සාකච්ඡා කරා. පළාත් සභාවෙ අය සමග සාකච්ඡා කලා. ටුවරිස්ට් බෝඩ් එකේ අය සමග සාකච්ඡා කරල අදාල ගිවිසුම් වලට එළඹුන ගිවිසුම් පළාත් සභාවෙත් නගර සභාවෙත් අනුමැතිය සහිතව තමයි අපි ගිවිසුමට ඉදිරිපත් වුනේ. මේක හදන්න ඉදිරිපත් වුනේ එක ටෙන්ඩරයක් විතරයි. ඒ අය ආරක්ෂිත ඇප මුදලක් වශයෙන් පළමුව ලක්ෂ 21 ක් ගෙව්ව. ඊට පසුව මාසිකව 175000.00 ගානෙ වර්ෂ 5 ක් ගිය විට 25% ක් වැඩි වෙන විදියට තමයි තීරණය වුනේ. මේ අය ලක්ෂ 100 කට වැඩිය මේ අවු පහේ අපට ගෙවල තියෙනවා. අපි පළමුව උත්සාහ ගත යුතුයි මෙතරම් මුදලක් අපට ගෙවපු සමාගම රදවා ගන්න. එහෙම නැත්නම් ඊලගට එන ආයෝජකයා අපි ගැන අවිශ්වාසයක් තියාගන්න පුලුවන් දේශපාලනය අනුව තීරණ වෙනස් වෙනවා කියලා. ගිවිසුම අවලංගු කරනවා නම් බේරුම්කරුවකු මගින් තමයි කරන්න වෙන්නෙ. ඒ නිසා මම ඉල්ලා සිටිනවා මේ ලිපි ගොනුවෙ ඕන දෙයක් බලන්න. රහස් දේවල් නැහැ. අපි කතා කරල සුදුසුම දේ නගරය වෙනුවෙන් කරමු. අපි කරල තියෙන්නෙ සුදුසුම දේ. මේ තානායමට 2002 ඉදන් 2013 දක්වා ආදායමක් ලැබිල නැහැ. අද ලක්ෂ 26 ක් විතර අවුරුද්දට ආදායමක් ලැබෙනවා. ඒ අයට බැහැයි කියනව නම් අපි පවර ගෙන වෙනත් දේකට යමු. මේ ගිවිසුම පළාත් සභාවෙ ඇමතිතුමාගෙ අනුමැතියෙන් පස්සෙ තමයි අපි අත්සන් කරේ. අපි තනියම කරපු දෙයක් නෙමෙයි. මේක දේශපාලනමය වශයෙන් කැඩුවයි කියල චෝදනා කරේ අපිට. නමුත් අපි කඩපු රෙස්ට් හවුස් එකක් නැහැ. අපිට එක්සත් ජාතික පක්ෂ 2002-2006 පාලන කාලෙදිත් 2006-2013 පළාත් සභාව සතුව පැවතුන කාලෙදිත් අහිමි කරපු ආදායම විශාලයි. අද වෙනකොට පාඩුවක් නැතිව යන්න අපි ඇති කරල තියෙනවා. ස්වාභාවික ජල තටාකය මේ බදු ගිවිසුමට අදාල නැහැ. ඒක ප්‍රෙවිශ මාර්ගයක් එක්ක වෙන් කරල තියෙන්නෙ. ඒ නිසා අපි සියළුම මන්ත්‍රීවරුන්ගෙ සහායෙන් මේක කරමු. ඊලග ආයොජකය අපි ගැන ඉදිරියට විශ්වාසෙ තියා ගන්නෙ කොහොමද කියල අපි බලන්න ඕනෙ. එනිසා ඕනෑම ලිපි ගොනුවක් පරීක්ෂා කරල බලන්න පුලුවන්. පහුගිය අවු 2 ½ කාලෙදි පළාත් සභාව වරදක් නොකලා කියල පෙන්නන් මේකෙ ලිපි අයින් කරල තියෙනවා. අපි මේකෙන් කිසිම හොරකමක් කරල නැහැ. ඕකයි ඇත්ත තත්වෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

කරිත්තකන්ද ප්‍රෙද්ශවාසීන්ගෙ ඉල්ලීමක් තියෙනවා පවතින පාරක් තවත් පාරකට සම්බන්ධ කිරීමක් සම්බන්ධව.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සීමාවෙ පවුල් හතරක් විතරයි නගර සීමාවට අයිති නැති පාරකින් එන්නේ. අපි ඒක කරමු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි කන්දෙ ළිද සකස් කරල දෙන්න කියල ඉල්ලීමක් කරා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වැඩ අධිකාරී මහත්මයා ඒක කරල දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මේ දවස්වල වැඩි දෙනෙක් කතා වෙනවා ජල සම්බන්ධය ලබා ගැනීම පිළිබඳ ප්‍රශ්නය. කලින් දේශපාලන අධිකාරියට දීල තිබුන ජල සම්බන්ධය ලබා දෙන්න කීප දෙනෙකුට. අපි අළුත් කණ්ඩායමක් නිසා ඒක ආයෙ ගන්න පුළුවන්නම් හොඳයි. නැත්තම් අපට ජල සම්පාදන මණ්ඩලයට විරුද්ධ වෙන්න වෙනවා. ලිස්ට් එකෙන් පිට සම්බන්ධතාවය දෙනවට.

මේ ප්‍රශ්නය නිසා මම යොජනාවක් කරන්න කැමතියි වැසි ජලය එකතු කරල ප්‍රෙයා්ජනයට ගන්න එක. අපිට නගර සභාව මගින් මේක කරන්න පුළුවන් නම් රු. 20000.00 ක් වගේ වියදමක් තමයි එක ගෙදරකට යන්නෙ. එතකොට ජල පරිභෝජනය 50% කින් අඩු වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා කතා කරමින්</u>**

මේධානන්ද මාවතේ ගෙයක් කඩපු එකක සුන්බුන් දාල තිබුනා. අපි ඒක ඉවත් කරා. නමුත් ඒ මනුස්සයා 2017-08-23 සල්ලි බැදලා තියෙනවා ඒක ඉවත් කරන්න. මෙතෙක් කල් කෙරිල නැහැ. ඒකට ගොඩක් දොස් කිව්වා නගර සභාවට.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලේකම් තුමිය ඕක තමයි ප්‍රශ්නෙ. මිනිස්සු මාස හත අට මෙහේට ඇවිල්ල තියෙනවා. වැඩ කෙරිල නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි නගර සභාවෙ සිකුරිටි එකේ අය කිව්ව කට්ටිය මදියි කියල. තව කීප දෙනෙක් ගන්නව නම් හොඳයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඉදිරියේදී බලමු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

සභාපතිතුමනි මහ අම්බලන්ගොඩ පොදු ළිද ප්‍රතිසංස්කරණයට අනුමත වෙලා තියෙන්නෙ. ඒක කරල දෙන්න. ජල සැපයුම විසන්ධි කරපු වෙලාවට ළිද ප්‍රෙයා්ජනවත් වෙනවා. ඒවගේම මහ අම්බලන්ගොඩ පාරෙත් ගස් වැවිල. යන්න අමාරුයි. ඒකත් සුද්ධ කරල දෙන්න කියල ඉල්ලා සිටිනවා. ඒවගේම තුඩුවමුල්ලෙ තොටුපොල සුද්ධ කරල දෙන්න කියල ඉල්ලීමකුත් කරනවා. එතන විෂමාචාර වැඩ කෙරෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

වැඩ අධිකාරී මහත්මයා ඒක ඇස්තමේන්තුව බලල කරන්න. ඒවගේම ඇස්තමේන්තු සකස් කිරීමේදී අදාල ප්‍රෙද්ශයේ මන්ත්‍රීතුමත් එක්ක යන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එස්. එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි පොල්වත්තෙත් තියෙනවා පිට්ටනිය ඉස්සරහ ළිදක්. එතන නගර සභා භූමියක්. එතන වෙනත් කෙනෙක් පදිංචි වෙලා අයිතිවාසිකමක් කියන්න කලින් ඒ ළිද සහ භූමි භාගය නිදහස් කරල වෙන් කරල තියා ගත්තොත් හොදයි කියල මට හිතෙනවා. මට පේනවා අනතුරක් ඒක පාවිච්චි කරනවා වෙනත් පිරිසක්.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

සභාපතිතුමනි මම ඕකන්දෙ ළිද ගැන කතා කරන්න කැමතියි. ඒ ළිද එක පාරක් හදන්න ගිහිල්ල එක පාරටම වහල දැම්ම. තව ළිදක් තියෙනවා ඒක අළුත්වැඩියා කෙරෙන්නෙත් නැහැ. ඕකන්දෙ ගෙවල් වලට ජල ප්‍රශ්නෙ ගොඩක්ම තියෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

සභාපතිතුමනි ඔතන පස බුරුලයි. බැකෝ යන්ත්‍රයක් දැමීමේදී කඩාගෙන ගියා. ඒක තුල තමයි වහල තියෙන්නෙ.

**ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

සභාපතිතුමනි සිලින්ඩර බස්සල කරානම් හරි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

වැඩ අධිකාරී මහතා ඇස්තමේන්තුවක් දෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

සභාපතිතුමනි ඕකන්දෙ පොදු ළිද නම් හදන්නම ඕනෙ.

ඒවගේම මේ මහජන ක්‍රීඩා පිට්ටනියේ තත්වෙ මොකක්ද? මිනිස්සු හරියට දොස් කියනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ක්‍රීඩා පිටියෙ තත්වෙ අපි එතකොට තිබුන විදිය දැක්කනෙ. අපි ක්‍රීඩා පිටිය සුද්ධ කරන්න ගත්තා. වහල හදන්න අපි පටන් ගන්නවා. දැනට ක්‍රිකට් බෝඩ් එකත් එක්ක කතා කරල තියෙනවා. තණකොල

ඇල්ලීමට සල්ලි හම්බ වෙන්නත් පුළුවන්. කොහොම වුනත් අපි මාස දෙකකට වැඩිය බලන් ඉන්නෙ නැහැ. අපි එකතු වෙලා හරි කරමු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි රණසූරිය මාවතේ තියෙනවා පොදු ළිදක්. ඒකත් කාලෙකින් සුද්ධ කරල නැහැ. ඒවගේම රණසූරිය පාරෙ ඇල ඉවුරු දෙකේ නොයෙකුත් අපචාර සිද්ද වෙනවා. මත්ද්‍රව්‍ය , කුඩු. ඒනිසා ඇල ඉවුර සුද්ද කර දෙන ලෙසත් ඉල්ලා සිටිනවා. ප්‍රධාන පාසලකුත් තියෙන නිසා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඇල ඉවුර අපි සුද්ද කරන තැනක් නෙමෙයි. අපි සුදුසු විදියට බලල කරමු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අපි බොහොම වැර වැයමෙන් භූමියක් ලබා ගත්තා ගමේ පරිත්‍යාගශීලියකුගෙන්. කෙරම්ණිය පින්නදූව ක්‍රීඩා පිටිය සඳහා. මේ දෙන පරිත්‍යාගය ගන්න ක්‍රමය අපි දන්නෙ නැහැ. ඔප්පුව මීට පෙර හිටපු ලේකම් තුමියට භාර දුන්නා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමා ඔප්පුව ඉල්ලගෙන භාර දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි ඒවගේම අපේ හිටපු මන්ත්‍රීවරයෙකු වන මහින්දසිරි මහත්මයගෙ පියතුමාගේ පරිත්‍යාගයක් විදියට කෙරම්ණිය පින්නදූව ළිද හැදුවෙ. මේකෙ කුඩුකාරයන් විසින් වටිනා ගල් ගලවල යට දෝනාව හැදිල. අපිට මෝටරයක් සහ කම්කරුවන් දෙදෙනෙක් දුන්නොත් අපිට නාන්න හදාගන්න පුළුවන්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වැඩ අධිකාරී මහතා කම්කරුවො දෙන්නයි ළඳ ඉහින එකයි දෙන්න. මම මන්ත්‍රීවරුන්ට කියන්න කැමතියි ගමේ කටයුතු ගමේ අය එකතු කරගෙන කරන්න ගන්න. අපි හැම උදව්වම දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අපිට ප්‍රිමික්ස් ලබා දෙනව නම් අපේ ගම් වැස්සො එක්ක එකතු වෙලා ඉක්මන්ට වලවල් ටික වහගන්න පුළුවන්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වැඩ අධිකාරී මහතා ජේනවනේ වැඩ. ඔබතුමාට තියෙන්නෙ බඩු ටික යවන්න විතරයි.

- **ප.ව' 2.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

බී. ඒ. ධම්මිකා,
ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව

අරුණ ප්‍රදීප් මණිමෙල් වඩු
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව

**2018 -04 - 05** වන දින

අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදී